*Vidyodaya J. Soc., Sci. Vol. 1, No. 2, July, 1987. pp 93—112*

# ලංකාව ලැබූ සර්ව ජන චන්දය

**අසෝක කැලේගම**

ඉතිහාස හා පුරා විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

ක්‍රි.ව. 1931 වර්ෂයේදී ලාංකික ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම සර්වජන චන්දය හිමිවුනි. මෙය ආසියාතික බ්‍රිතාන්‍ය යටත් විජිතයක්, දේශපාලනමය වශයෙන් ලබාගත් විශාල වරප්‍රසාදයක් ලෙස පිළිගැනේ. එයට හේතුව, එංගලන්තයේ වුවද ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම සර්වජන චන්දය හිමිවූයේ ක්‍රි.ව. 1928 වර්ෂයේදී නිසයි.

ලංකාවට සර්වජන චන්දය ලැබීම නිසා දේශපාලනමය වශයෙන් ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි හා දේශපාලන පක්ෂ ක්‍රමයෙහි දියුණුවක් ඇති වූ බව පිළිගත යුතුය. නමුත් පක්ෂ ක්‍රමය මත රැඳුණු පරිපාලනය මගින් ලංකාව තුළ දියුණුවක් සිදුවීද යන්න තර්ක ගෝචරය. එක් එක් දේශපාලන හා වාර්ගික පක්ෂ අතර ඇතිවූ සංග්‍රාමයක් විනා ප්‍රංශය, එංගලන්තය, වැනි බටහිර රටවල මෙන් බුද්ධිමත්ව ලාංකික දේශපාලනඥයින් ලංකාවේ පක්ෂ ක්‍රමය යොද ගත්තේ ද යන්න සැකයට තුඩු දෙන්නකි. ක්‍රි.පූ. 427–347 ජීවත් වූ ග්‍රීක දර්ශනික ප්ලේටෝ ගේ පරමාදර්ශී රාජ්‍යය සඳහා ඉදිරිපත් කළ බුද්ධිමත් පාලක පංතියක් වැනි පාලක පංතියක් සර්වජන චන්දය මගින් තේරී පත්වී නම් මෙයට වඩා සේවයක් සිදුවනු නො අනුමානය. ප්ලේටෝ ගේ පාලක පංතිය, යුද්ධමය පුහුණුවක් ලැබූ, අඹුදරු සබඳතා වලින් ඈත්වූ දූෂණය හා අල්ලස වැනි අධර්ම වලින් තොර යුක්ති ගරුක වයෝවෘද්ධ (වයස 50 ට වැඩි) පාලක පංතියකි.[1] ආරක්ෂක පංතියට මෙන්ම ප්ලේටෝ ගේ පාලක පංතියටත් දේපල උරුමය අහෝසි කිරීමෙන් පාලක පංතිය තව දුරටත් සදචාරවත් පාරිශුද්ධික ජන කොටසක් බවට පත්වේ.[2] ලංකාවට ලැබුණු සර්වජන චන්දය මාර්ගයෙන් දියුණුවට පත් වූ ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයට ලංකාවෙහි යුක්තිගරුක පාලනයක් බිහි කිරීමට නොහැකි වුවද, සර්වජන චන්ද ක්‍රමය හේතුවෙන් රටේ වෙනත් අංශවල සීඝ්‍ර දියුණුවක් ඇති වී තිබෙන බව පිළිගත යුතුවේ.

ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත බලය ක්‍රි.ව. 1815 දී පූර්ණ ලෙස ස්ථාපනය වීමෙන් පසු ක්‍රි.ව. 1833 දී ඉංග්‍රීසිහු, ව්‍යවස්ථාදායක සභාවක්, ලංකාණ්ඩුක්‍රම සංවර්ධනයට අදල වන අයුරින් හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීමේ අරමුණ වූයේ ලාංකික යටත් විජිත වාසීනට නියෝජනයක් ලබාදීමයි.[3] ආණ්ඩුකාරයාගේ අසීමිත බලය මැඩ පැවැත්වීම අනෙක් පරමාර්ථයයි.[4] මෙම සභාවට නියෝජිතයින් තේරීමේදී චන්ද ක්‍රමයකට අනුව එය සිදුවිය යුතුයයි මුල් කාලයේ සිටම උද්ඝෝෂණ දක්නට ලැබුණි. ඒ කෙසේ වුව ද මෙම කවුන්සිලයේ නිල නොලත් මන්ත්‍රීන් පත්කරනු ලැබුවේ. බ්‍රිතාන්‍ය රජය විසින් නම් කිරීමෙනි. ක්‍රි.ව. 1837 දී ව්‍යවස්ථාදායක සභාවට අලුතින් නිලනොලත් සාමාජිකයින් 02 කු ඇතුළත් කරන ලද අතර ක්‍රි.ව. 1845 දී ඒ සංඛ්‍යාව පුළුල් වී නිලනොලත් මන්ත්‍රීන්ගේ ගණන 06 දක්වා වැඩි වූ අතර නිලලත් සංඛ්‍යාව 10 ක් වුණි.[4] නිලනොලත් මන්ත්‍රීන් වාර්ගික ලෙස නම් කරන ලද බව පෙනේ. යුරෝපීන් 03 යි,

---

1. William Ebenstein : *Great Political Thinkers*, Oxford and IBH Publishing, Calcutta pp. 4—5.
2. Phillis Doyle : *A History of Political Thought*, p. 31.
3A. K. M. de Silva : An Article on "Some pioneers in the agitation for elective representation," in the Universal Franchise 1931-1981, The Srilankan Experience p. 4.
3බී. ඩබ්. ජේ. එෆ්. ලැබ්‍රෝයි.—ලංකාවේ ව්‍යවස්ථාදායක සභා වර්ධනය, තිසර පළවෙනි කාණ්ඩය ඉතිහාසය අංක 3, පිටුව 141.
4. *Report of the Special Commission on the Ceylon Constitution*, 1928, p. 12.

සිංහල, දමිල හා බර්ගර් ජාතීන් වෙනුවෙන් එක් අයෙකු බැගින් පත් කරණ ලදී. සමස්ථ ලෙස බලන කල මෙම කවුන්සිලය කිසිම වැදගත් ප්‍රතිසංස්කරණයකට හසු නොවී, යටත් නොවී, වර්ෂ 80 ක පමණ කාලයක් ක්‍රියාත්මක වී ඇත.[5] ඉහත කී කවුන්සලයට නිලනොලත් නියෝජිතයින් චන්දයෙන් තෝරාගත යුතුය යන යෝජනාව මුලින්ම ඉදිරිපත් වූයේ ක්‍රි.ව. 1840 දී ලංකාවට පැමිණි, වෛද්‍යවරයකු මෙන්ම පුවත්පත් කලාවේදියෙක් වූ ක්‍රිස්ටෝපර් එලියට්[6] විසිනි. ඔහුගේ පුවත්පත වූයේ "ද කලම්බු ඔබ්සවර්" පත්‍රයයි. ක්‍රි.ව. 1843 දී ඔහු ලාංකිකයින් සමඟ මිත්‍ර සංගමයක් ආරම්භ කළේ ය. මොහු ගේ දෙශපාලන ඉල්ලීම් පිළිබඳව එකල ලාංකික දේශපාලනඥයින් එතරම් උනන්දුවක් නොදක්වූයේ සියළු දෙනාම පාහේ මුදල් උපයීම සඳහා කෝපි කර්මාන්තයේ නියුක්තවූ බැවිනි. ඇංග්ලිකන් ආගමික මිෂනාරි ව්‍යාපාරයට විරුද්ධ වූ එලියට් රජයේ සේවයෙන් ඉල්ලා අස් වී පුද්ගලික වෛද්‍ය සේවයට ඇතුල් වී කෝපි වගාව සඳහාද උනන්දු විය.[7] ප්‍රංශ යටත් විජිතයක් වූ ඉන්දියාවේ පොන්ඩිචේරියේ වැසියන්ට තමන් වෙනුවෙන් ප්‍රංශ රාජ්‍ය මන්ත්‍රණ සභාවට නියෝජිතයෙකු යැවීමට මේ වනවිට ඉඩ ලැබී තිබුණි.[8] ඉංග්‍රීසින් ලාංකිකයින්ගෙන් බදු අයකරන්නේ නම්, එම බදු අයකරන ස්ථානය සඳහා ලාංකිකයින්ගේ නියෝජනයක් තිබිය යුතුය. එය පිළිගත් ව්‍යවස්ථානුකූල ප්‍රතිපත්තියකි. යයි එලියට් තම "ද කලම්බු ඔබ්සවර්" පුවත්පත මගින් ප්‍රකාශ කළේය. දිව සහ පෑන ප්‍රධාන ආයුධය කරගත් ඉංග්‍රීසින් එංගලන්ත රැජිණ හා පාර්ලිමේන්තුව වෙත පෙත්සමක් ඉදිරිපත් කරමින් තම රටේ නරක නීතිරීති වෙනස් කර ගැනීමට සමත් වූහ.[9] සමකාලීන ලාංකික දේශපාලනඥයින් ක්‍රිස්ටෝපර් එලියට් තරම් චන්ද නියෝජනය සඳහා උනන්දුවූ වගක් නොපෙනේ. ක්‍රි.ව. 1850 දී යුරෝපීය වැවිලිකරුවන් හා වෙළඳුන් ලංකික නිල නොලත් මන්ත්‍රී සංඛ්‍යාව වැඩි කර ගැනීමට උද්ඝෝෂණය කර ඇති මුත් චන්ද ක්‍රමය ගැන උනන්දුවක් වී නැත. නිලනොලත් මන්ත්‍රීන් වැඩිකර ගැනීමේ ඉල්ලීම වූවද සර් හෙන්රි වෝඩ් ආංඩුකාරයා විසින් ප්‍රතික්ෂේප කර ඇත. ලංකාවේ බහුතර ජනතාවට දේශපාලනමය අවබෝධය නොමැති අවස්ථාවක නිලනොලත් බහුතරයකින් අනවශ්‍ය වාසි වාර්ගික ලෙස බ*ගර් වරුන්ට ලැබේ යයි ඔහු පෙන්වා දී ඇත.[10] මේ අතර ලංකා ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් මන්ත්‍රීවරු කරුණු 2 ක් මත ඉල්ලා අස්වූහ. 1 නිල නොලත් සංඛ්‍යාව පුළුල් කිරීම, 11 චන්ද බලය පුළුල් කිරීම. මෙකල චන්ද බලය පුළුල් කිරීම මාර්ගයෙන් බලාපොරොත්තු වූයේ සමාජයේ ඉහළ පන්තියේ චන්ද බලය පුළුල් කිරීමකි. ඉහත කී ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ එංගලන්ත යටත් විජිත කාර්යාලය පැහැදිලිවම ප්‍රකාශකළා, ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයට අයත් යටත් විජිතයක් ලෙස පවත්වාගෙන යාම තම සම කාලීන ප්‍රතිපත්තිය බව.[11A] මේ අනුව ක්‍රි.ව. 1870 පමණ වන විට බ්‍රිතාන්‍ය යටත් විජිත කාර්යාලයේ ලංකාව පිළිබඳව ආකල්පය වූයේ නූගත් බහුතර ලාංකිකයින් තුළ චන්ද නියෝජනයක් සඳහා අවබෝධයක් නැති බවත්, ඒ නිසාම ඉහත කී බහුතර ජනතාවගේ ප්‍රයෝජනය තකා යහපත් පාලනයක් ගෙනයා යුතු බවත් ය. ලිබරල්වාදී සර් විලියම් ග්‍රෙගරි පවා සමකාලීන ලෙස ව්‍යවස්ථාදායක සභාවේ වෙනසක් අපේක්ෂා නොකළ අතර ඔහු වැඩිපුර කල්පනා කළේ ලාංකිකයින්ගේ

---

5. *Ibid.* p. 12.
   K. M. de Silva : *History of Ceylon*, University of Ceylon, Colombo, 1973, pp. 226–248
6. K. M. de Silva : "Some early pioneer s ........" *op-cit*, p. 5.
7. K. M. de Silva : "Some early pioneer s." *op-cit*, pp. 5-7.
8. *Ibid.* p. 8
9. *Ibid.* p. 9.
10. *Ibid.* p. 10.
11A. K. M. de Silva : "Some early pioneers........" "*op-cit*, p. 11.

නූගත් භාවය දුරු කළයුතු අන්දම ගැනය. නමුත් 1875 දී චන්ද ක්‍රමයට අදාල වැදගත් ඉල්ලීමක් සිලෝන්ලීග් (Ceylon Leauge) මගින් කරන ලදී. එය චේම්බර් ඔප් කොමර්ස් මගින් ඉදිරිපත් වුණි. එනම් නිලලත් මන්ත්‍රීට සෑම අවස්ථාවක දීම ඔවුන්ගේ පුද්ගලික විශ්වාසයක් අනුව චන්දය දීමට අවසර දෙන ලෙසයි.[11B]

සමකාලීන ලෙස ''ද කලම්බු ඔබ්සර්වර්'' පත්‍රයේ කර්තෘ ලෙස කටයුතු කළ ඒ. ඇම්. පර්ගියුසන් සමඟ සේවයට පැමිණි තරුණ පුවත්පත් කලා වේදියෙකු වූ විලියම් ඩිග්බි ප්‍රකාශ කර සිටියේ ක්‍රි.ව. 1833 න් පසු ලංකාවේ ආර්ථික අංශයේ වෙනසක් සිදු වී තිබෙන බැවින් දේශපාලන ලෙස චන්දයෙන් තෝරා පත් කරන නියෝජිත මඩුල්ලක් අවශ්‍ය තාවය දැන් පැමිණ ඇති බවයි.[12] ක්‍රි.ව. 1879 දී ශ්‍රී මුත්තු කුමාරස්වාමි ගේ අභාවයෙන් කවුන්සිලයේ ඇති වූ පුරප්පාඩුව විලියම් ඩිග්බි විසින් පිරවීම නිසා ලංකාණ්ඩුක්‍රම සංවර්ධනය වෙනුවෙන් මොහු ඉතා දක්ෂ ලෙස තම අදහස් ඉදිරිපත් කරන ලදී.[13] නමුත් ක්‍රි.ව. 1879 වන විටත් ලාංකික දේශපාලනඥයින් තුළ චන්දයෙන් තෝරාගනු ලැබූ කවුන්සිලයක් පිළිබඳව උනන්දුවක් තිබූ බවක් නොපෙනේ. කෙසේ වුවද, ක්‍රි.ව. 1889 දී කවුන්සිලයේ නියෝජිත නිලනොලත් සංඛ්‍යාව 08 දක්වා බ්‍රිතාන්‍ය රජ විසින් පුළුල් කරන ලදී.[14] ඒ අනුව සංයුතිය මෙසේ විය. පහතරට සිංහලයින් 01, ද්‍රවිඩයින් 01, බර්ගර් 01, වැවිලිකරුවන් 01, වාණිජයින් 01, යුරෝපීයන් 01, මුවර්වරු 01, සහ, උඩරැටියන් 01 කි.[15]

ක්‍රි.ව. 1893 දී ''ද සිලෝන් ඔබ්සවර්'' පත්‍රයේ කර්තෘ වූ ජෝන් පර්ගියුසන් පෙන්නා දුන්නා ලංකාවේ කවුන්සිලයට චන්ද නියෝජන ක්‍රමයක ඇති අවශ්‍යතාවය. පොන්නම්බලම් අරුනාචලම් හා විලියම් ඩිග්බි යන දෙදෙනා එක් වී එංගලන්ත රජය වෙත ඉහත කී කරුණ පිළිබඳව කරුණු දක්වමින් ලිපි ලියන ලද නමුත් ක්‍රි.ව. 1899 වන විට එංගලන්ත යටත් විජිත කාර්යාලයේ ප්‍රතිපත්ති ඉතා දරදඬු ස්වරූපයක් ගෙන තිබීමේ ප්‍රතිඵලය වශයෙන් ලංකාවට පුළුල් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ලබාදීම ප්‍රතික්ෂේප කෙරුණි. ක්‍රි.ව. 1906 දී එංගලන්තයේ ලිබරල් පක්ෂයේ ජයග්‍රහණයත්, ක්‍රි.ව. 1907 දී මෝර්ලි ඉන්දියාවේ ඉදිරිපත් කළ අයවැය දේශනයක් නිසා ලාංකිකයන් තුළත් පුළුල් ආණ්ඩුක්‍රම ප්‍රතිසංසකරණ පිළිබඳව බලාපොරොත්තු ඇති විය. ක්‍රි.ව. 1907 දී ඒ ශාන්ත වී ජයවර්ධන සහ එෆ්. ජේ. ද මැල් දෙදනා විසින් පළකරන ලද ලිපි වලින් ලංකාවේ ක්‍රියාත්මක වන නම් කිරීමේ ක්‍රමය වෙනුවට චන්ද ක්‍රමය ඉල්ලා සිටින ලදී.[16] නමුත් ඒ ප්‍රතිඵල රහිත වුණි. මේ කාලය වන විට ලංකාවේ දේශපාලන උද්ඝෝෂණ ආකල්ප 3 කින් ඉදිරිපත් වී තිබුණි. එනම් වාර්ගීය, ප්‍රදේශීය හා විවෘත වශයෙනි. බර්ගර් සංගමය වාර්ගීය ලෙසත්, හලාවත හා යාපන සංගම් ප්‍රාදේශීය ලෙසත්, ලංකා ජාතික සංගමය හා ල කා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය , විවෘත වශයෙනුත් හැඳින්විය හැක.[17] ක්‍රි.ව. 1889 දී කවුන්සිලයේ නිලනොලත් සංඛ්‍යාව පුළුල්වීමත් පොදු උද්ඝෝෂන වැඩිවීමත් නිසා ඉහතින් සඳහන් කළ දේශපාලන සංගම් අතර එක්සත් භාවයක් ක්‍රමයෙන් වර්ධනය වුණි. ලංකා ජාතික සංගමය නියෝජනය කළ සර් ජේම්ස් පීරිස් ක්‍රි.ව. 1908 දී යටත් විජිත පිළිබඳ රාජ්‍ය ඇමති වෙත සංදේශයක් ඉදිරිපත් කරමින් කවුන්සිලය සඳහා

---

11B. ඩබ්ලිව්. ජේ. එෆ්. ලැබ්‍රෝයි. පිටුව 151.
12. K. M. de Silva : "Some early pioneers......" *op--cit*, p. 13.
13. *ibid.* p. 14.
14. Report of the Special Commission ...... *op-cit*, p. 12.
15. *Ibid.* p. 12.
16. R. A. Ariyaratne : An Article on "The beginnings of elective representation 1908-1912', in the *Universal Franchise* 1931-1981, The Srilankan Experience, 1981 p.22
17. *Ibid.* p. 21.

නිලලත් 13 ක් සහ නිලනොලත් 12 ක් ඉල්ලා සිටින ලදී. ඒ සමගම සීමිත චන්ද ක්‍රමයකින් නියෝජිතයන් තේරීමේ අවශ්‍යතාවද ඔහු ඉල්ලා තිබුනි. හලාවත සංගමය කියා සිටියේ නිලනොලත් පක්ෂයට වඩා නිලලත් පක්ෂය පුළුල් නොවිය යුතු බවයි. නිලලත් හා නිල නොලත් පක්ෂ දෙක අතර සමතාවයක් තිබිය යුතුය යන්න යාපන සංගමයේ අදහස වුනි.[18] කෙසේ වුවද වාර්ගික නියෝජනය අවලංගු කිරීමටත්, චන්දයෙන් තෝරා ගන්නා නියෝජිතයින් සහිත කවුන්සිලයක් පත්කිරීමටත් අවශ්‍යය යන හැඟීම සමකාලීන ලෙස ලාංකික දේශපාලනඥයින් තුළ දක්නට ලැබුණි.[19] නමුත් ලංකාවේ සිටි මැක්ලම් ආණ්ඩුකාරයා (ක්‍රි.ව. 1907—1913) ලාංකික උගත් දේශපාලනඥයින්ගේ අදහස් පිළි නොගෙන යටත් විජිත ලේකම් හියු ක්ලිෆර්ඩ් හා එක්ව උගත් ලාංකිකයින්ගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලදී.[20]

ලංකාවට චන්ද ක්‍රම පිළිබද ප්‍රතිපත්තිය හැඳින්වීම ගැන පහතරට සිංහල නියෝජිත එස්. සී. ඔබේසේකර තදින්ම කවුන්සිලයේදී විවේචනය කළ නමුත් ඇටර්නි ජනරාල් වෝල්ටර් පෙරේරාගෙන් චන්ද ක්‍රමයට නොමද සහාය ලැබුණි.[21] කෙසේ හෝ 1910 නොවැම්බර් 24 දින බ්‍රිතාන්‍ය රාජකීය උපදෙස් මත ලංකා ව්‍යවස්ථාදායක සභාව පිළිබදව පහත දැක්වෙන සංශෝධන සිදුවුණි. ඒ මගින් ලංකාවේ ප්‍රථම වරට සීමිත ලෙස චන්ද ක්‍රමය, නියෝජිතයින් තේරීම සඳහා යොදා ගනු ලැබීය. මේ අනුව ව්‍යවස්ථා දායක සභාව සමාජිකයින් 21 දෙනෙකුගෙන් සමන්විත වුණි. නිලලත් 11 දෙනෙකි.[22] නිල නොලත් 10කි. ඉන් 4 ක් චන්ද ක්‍රමයෙන් ප්‍රථමවරට තෝරනු ලැබීය. ග්‍රාමීය හා නගර බද යුරෝපියන් 2 ක් ද බර්ගර් ජාතිකයෙක් ද එක් උගත් ලාංකිකයෙක් ද වශයෙන් ඒ 4 දෙනා චන්දයෙන් පත් කෙරුනි. ඉතිරි 6 දෙනා වර්ගීය ලෙස බ්‍රිතාන්‍ය රජය විසින් නම් කරන ලදී. ඉහත කී ප්‍රතිසංස්කරණයට ප්‍රතිචාරයක් වශයෙන් යාපන ද්‍රවිඩ සංගමයේ ඉල්ලීම් මෙහි දී වැදගත් වේ. ක්‍රි.ව. 1910 ආණ්ඩුක්‍රමය තුළින් සිංහල බහුතරයේ බලපෑමක් පිළිබඳ බියක් ද්‍රවිඩයින් තුළ තිබුණි. මේ නිසා උගත් ලාංකිකයින් වෙනුවෙන් නියෝජිතයින් දෙදෙනකු පත් කරන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ.[23] මැක්ලම් ආණ්ඩුකාරයා සහ යටත් විජිත ලේකම් හියු ක්ලිෆර්ඩ් එම තර්කයේ සාධාරණත්වයක් ඇති බව පිළිගත් අතර ජාතීන් අතර භේද සහ කුළ භේද අතිවීම තම පාලනය පහසු කර ගැනීමට හේතුවන බව ඔවුහු හොඳින්ම දැන සිටියහ. සිංහල ද්‍රවිඩ භේදය පමණක් නොව මේ වන විට බර්ගර් වරුන් අතරත් පෘතුගීසි බර්ගර් හා ලන්දේසි බර්ගර් යනු වෙන් භේද තිබුණි.[24]

ක්‍රි.ව. 1910 ආණ්ඩුක්‍රමය අනුව, උගත් ලාංකිකයින් සඳහා බිහිකළ අසුනට පොන්නම් බලම් රාමනාදන් සහ මාකස් ප්‍රනාන්දු ඉදිරිපත් වූහ. රාමනාදන් ද්‍රවිඩ ජාතිකයෙකු වුවද ගොවි කුළයට අයත් වුණි. ප්‍රනාන්දු සිංහල ජාතිකයකු වුවද කරාව කුළයට අයත් වුණි. රාමනාදන් ජනප්‍රිය දක්ෂ පුද්ගලයකු වූ නිසා මැතිවරණයෙන් පහසුවෙන්ම ජය ලැබීය. මෙම අසුන සඳහා සිටි චන්දදායකයින් 2957 දෙනාගෙන් බහුතරය සිංහල යින් වූ නමුත් පොන්නම්බලම් රාමනාදන් ජය ලැබුවේ කුළභේදය උඩයයි මැක්ලම් සහ හියු ක්ලිෆර්ඩ් දෙදෙනාගේ අදහස විය.[25] ඒ කෙසේ වුවද පොන්නම්බලම් ගේ

---

18. R. A. Ariyaratne : "The beginnings........." *op-cit*. p. 22.
19. Report of the Special Commission......... *op-cit*. p. 13.
20. R. A. Ariyaratne : "The beginnings" *op-cit*. pp. 22-23.
21. *Ibid*. p. 23.
22. *Ibid*. p. 25.
    Report of the Special Commission......... *op-cit* p. 24.
23' R. A. Ariyaratne : "The beginnings......" *op-cit*. p. 25.
24. *Ibid*. p. 25.
25. *Ibid*. p. 27.

මෙම ජයග්‍රහණයෙන් පිළිබිඹු වූ වැදගත් කරුණ වන්නේ සිංහලයින්ගේ පරිත්‍යාගශීලී භාවය සහ සිංහල ද්‍රවිඩ සමගියයි.[26] ක්‍රි.ව. 1917 මැතිවරණයේදී පොන්නම්බලම් රාමනාදන් ගොවිකුළ සිංහලයකු හා තරඟ කොට නැවත වරක් ජය ලැබීමෙන් ඉහත කී අදහස තහවුරු වූ අතර හියු ක්ලිෆර්ඩ් හා මැක්ලම් ගේ සිතුවිලි බිඳ වැටුණි. මෙම ජයග්‍රහණය නිසා ව්‍යවස්ථාදායක සභාවේ ද්‍රවිඩ නියෝජිත සංඛ්‍යාව 03 දක්වා වර්ගීය ලෙස ඉහළ ගිය බව පිළිගත යුතුය. එය ද්‍රවිඩයන් ලැබූ ජයග්‍රහණයකි.

ක්‍රි.ව. 1910 න් පසු ඉන්දියාව, අයර්ලන්තය හා ඊජිප්තුව වැනි බ්‍රිතාන්‍ය සෙසු විජිතවල ආංඩුක්‍රම සංවර්ධනය සඳහා දැඩි උද්ඝෝෂණ ඇතිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ ද එක්තරා පිබිදීමක් දක්නට ලැබේ. නමුත් ක්‍රි.ව. 1915 ඇති වූ සිංහල මුස්ලිම් අරගලය නිසා එයට එක්තරා පසුබෑමක් ඇති වූ අතර මේ වන විට ජනප්‍රියව තිබූ අමද්‍යප ව්‍යාපාරයත් ඒ නිසාම අඩප ණ වුණි.[27] මේ කාලය වනවිට ලංකා ජාතික සංගමයත් කම්මැලි ස්වරූපයක් පෙන් වූ බැවින් ලංකාවට මීට වඩා බලවත් හා ශක්තිමත් දේශපාලන සංවිධානයක අවශ්‍යතාවය දක්නට ලැබුණි. මේ නිසා ඉන්දියාවේ කොංග්‍රසයට සමාන ආයතනයක් පිහිටුවීමේ අභිලාෂය පහතරට සිංහල දේශපාලනඥයින් තුළ දියත්වන්නට වුණි. මෙම පිබිදීම කෙරේ ලංකා ජාතික සංගමය සැක පහළ කළා පමණක් නොව තම අප්‍රසාදයද පළ කරන ලදී. ගතානුගතික අදහස් දරූ ලාංකිකයන් ලංකා ජාතික කොංග්‍රසයක් සඳහා විරුද්ධ වූ අතර එමගින් ඇතිවිය හැකි සුළු ජාතික බලපෑම් හා ආගමික මෙන්ම කුළ බලපෑම් ගැනද බිය වූහ.[28] ක්‍රි.ව. 1917 ඉන්දියාවේදී එඩ්වින් මොන්ටේගු ගේ ප්‍රකාශය ඉන්දියාවේ ස්වයං පාලනය සඳහා ඉඟියක් ලබා දීමකි. මේ හේතුව නිසා ලංකාව තුළ නැවතත් ප්‍රතිසංස්කරණ පිළිබඳව පිබිදීමක් ඇතිවුණි. ක්‍රි.ව. 1917 දී සිලෝන් රිෆෝම් ලීග්[29] (Ceylon Reform league) සහ ලංකා ජාතික සංගමය බ්‍රිතාන්‍ය රාජ්‍ය ලේකම් වෙත කරුණු ඉදිරිපත් කරමින් ප්‍රාදේශීය ඡන්දයෙන් තෝරාගත් නිලනොලත් බහුතරයක් ව්‍යවස්ථාදායක සභාව තුළ තිබිය යුතු යයි ඉල්ලා සිටින ලදී.[30] මේ අතරම, ඉන්දීය ජාතික කොංග්‍රසයේ ආභාසය ලැබූ පහතර ට සිංහල ප්‍රභූ පිරිසක් විසින් ලංකා ජාතික කොංග්‍රසය පිහිටුවා ගන්නා ලදී. මෙය පිහිටුවා වර්ෂ 2 කට පසුව කොංග්‍රසය විසින් බ්‍රිතාන්‍ය රජය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම් අතර ඡන්ද ක්‍රමයට අදාල ඉල්ලීම් කිහිපයක් ද දක්නට ලැබුනි.[31] එම ඉල්ලීම් :

(i) ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් 50 ක් විය යුතු අතර එයින් 40 දෙනෙක් ප්‍රාදේශීය ඡන්දයෙන් තෝරා ගත යුතුය.
(ii) පිරිමින් සඳහා පුළුල් ඡන්ද බලය ලැබිය යුතුය.
(iii) ස්ත්‍රීන් සඳහා සීමිත ඡන්ද බලය ලැබිය යුතුය.
(iv) ව්‍යවස්ථාදායක සභාවේ කථානායක තුමා ඡන්දයෙන් තෝරා ගත යුතුය
(v) විධායක සභාවේ සංඛ්‍යාවෙන් හරි අඩක් ඡන්දයෙන් තේරී පත්වූ නිලනොලත් සාමාජිකයින් විය යුතු ය.

---

26. *Ibid.* p. 27.
27. K. M. de Silva: An article on "Constitutional Reform and Elective Representation in the 1920's", *Universal Franchise* 1931—1951 *the Srilankan Experience.* p. 31
28. *Ibid.* pp. 31—32.
29. මෙම සංගමයේ ප්‍රථම සභාපතිවරයා සර් පොන්නම්බලම් අරුනාවලම් වේ. සිංහලයින් අතර ඉතා ජනප්‍රිය වූ ඔහු කෘතහස්ත දේශපාලනඥයෙකු විය. ක්‍රි.ව. 1920 තෙක් සිංහල ද්‍රවිඩ සමගිය රැකීමේ වගකීම මොහුමත පැවරේ.
30. Report of the Special Commission on the Ceylon Constitution p. 13.
31. Report of the Special Commission...... *op-cit.* p. 14.

ලංකාවේ චන්ද ක්‍රමය පුළුල් කිරීම උදෙසා ඉහතකී ඉල්ලීම් ඉතා වැදගත් කොට සැලකිය යුතුය. මේ අනුව ලංකා ජාතික කොංග්‍රසයේ ඉල්ලීම් අගය කළ හැක. ලංකා ජාතික කොංග්‍රසය ලාංකික ජාතික සමගිය හා වාර්ගික සමගිය ඇතිකිරීමෙහිලා උනන්දු වූ බැවින් ක්‍රි.ව. 1920 කාලය පමණ වනතෙක් බ්‍රිතාන්‍යයින් බලාපොරොත්තු නොවූ අයුරු ජාතික සමගියක් දක්නට ලැබුණි. මේ යුගයේදී ම ඒ. ඊ. ගුණසිංහ ගේ මූලිකත්වයෙන් බිහි වූ තරුණ ලංකා සංගමයට අවශ්‍ය වූයේ මහත්මා ගාන්ධිගේ සංකල්පය වූ ස්වරාජ ක්‍රමයයි.[32] මෙයට අමතරව උඩරට සංගමය හා ලාංකික යුරෝපීයන්ගේ සංගමයද තම ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. මේ වකවානුවේ දී ලංකාණ්ඩුකාර වූ මැනිං ලංකාවට හදිසි ආංඩුක්‍රම ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාවය නොදුටුවේය. මැනිං ප්‍රකාශ කළා ලංකා ජාතික කොංග්‍රසය පහතරට සිංහල ප්‍රභූවරුන්ගේ බලවේගයක් බැවින් එය ලංකාවේ මුළුමහත් ජනතාවම නියෝජනය නොකරන බව. උඩරැටියන් තුළ ලංකා ජාතික කොංග්‍රසය කෙරේ ප්‍රසාදයක් නොවීය. මෙහි දී ලාංකික ප්‍රභූවරුන් තුළ තිබූ භේදය මැනිං තම වාසියට හරවා ගත් බව කිව හැක. ක්‍රි.ව. 1919 ලංකාවට පැමිණි සර් විලියම් මැනිං දේශපාලන කටයුතු අතින් අති දක්ෂ ඉංග්‍රීසි ආංඩුකාර වරයකු ලෙස පිළිගැනේ.[33] උවමනාවෙන්ම උඩරට නියෝජිත පිරිසක් එංගලන්තයට යැවීමෙන් ඔහුගේ පරිපාලන කෘතහස්ත භාවය පැහැදිලි වේ. උඩරැටියන්ගේ දූත මෙහෙවරයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුනට මැනිං විසින් වාර්ගික නියෝජනයක් ලබා දෙන ලදී. සියළු දෙනාගේම ඉල්ලීම් සලකා බැලූ ඉංග්‍රීසි රජය ක්‍රි.ව. 1920 අගෝස්තු මස නව ආංඩුක්‍රම ප්‍රතිසංස්කරණය ඉදිරිපත් කරන ලද අතර එය මැනිං ආංඩුක්‍රමය ලෙස හැඳින්වේ. ඒ අනුව ව්‍යවස්ථාදායක සභාව 37 කින් සමන්විත වුණි. මෙයින් 14 ක් නිලලත් වූ අතර 23 ක් නිලනොලත් වූහ. නිලනොලත් 23 දෙනා ගෙන් 11 දෙනෙක් ප්‍රාදේශීය චන්දයෙන් ද 8 දෙනෙක් නම් කිරීමෙන් ද පත්වුණි. 8 දෙනා පත් වූ අයුරු මෙසේය. යුරෝපින් 02, බර්ගර් 01, පහතරට වැවිලිකරු 01, උඩරැටියන් 02, ඉන්දියානුන් 01, ඉතිරි මන්ත්‍රීන් 4 දෙනා ආංඩුකාරයා විසින් නම් කරන ලදී. ක්‍රි.ව. 1910 දී ආරම්භ කෙරුණු චන්ද ක්‍රමය තව දුරටත් ක්‍රි.ව. 1920 දී පුළුල්වීම වැදගත් ය. ක්‍රි.ව. 1920 ආංඩු ක්‍රමයේ විශේෂ ලක්ෂණයක් ලෙස ප්‍රථම වරට නිලනොලත් බහුතරය ඇති වීම දැක්විය හැක. නමුත් එය චන්දයෙන් පත්වූවන්ගේ බහුතරයක් නොවීය. නම්කරන ලද මන්ත්‍රීන් නිතරම ආංඩු පක්ෂයේ තීරණ පිලිගැනීම නොවැලක්විය හැක්කකි. ක්‍රි.ව. 1921 මහාමැතිවරණයෙන් පසු සිංහල ද්‍රවිඩ භේදය ආරම්භ වුණි. මේ වනවිට ක්‍රි.ව. 1920 දීම සර් පොන්නම්බලම් අරුනාවලම් ජාතික කොංග්‍රසයෙන් ඉල්ලා අස්වී සිටියේය. මේ අතර උඩරැටියනුත් සුළු ජාතියක් ලෙස ඉදිරිපත් වෙමින් මැනිංට ආධාර කිරීම නිසා ජාතික සමගිය තවත් පළුදු විය. බෙදු පාලනය මේ යුගයේ බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස පෙන්වන අයුරින් මැනිං ඉහත කී ජාතික අසමගිය තම ප්‍රයෝජනයට හරවා ගති. ක්‍රි.ව. 1920 ට පෙර සිංහල ද්‍රවිඩ මන්ත්‍රී අනුපාතයේ සමානුපාතයක් තිබුණු නමුත් ක්‍රි.ව. 1921 මැතිවරණයෙන් සිංහල මන්ත්‍රී සංඛ්‍යාව 13 දක්වා වැඩි වූ අතර ද්‍රවිඩ සංඛ්‍යාව වූයේ 03 ක් පමණි. මේ නිසා ද්‍රවිඩයින් ක්‍රි.ව. 1920 ට පෙර තමන්ට තිබූ අයිතිය ඉල්ලා සිටියහ. මේ අතර බස්නාහිර පළාතේ ද්‍රවිඩයින් සඳහා වෙනම ආසනයක් ඉල්ලීම නිසා සිංහල ද්‍රවිඩ අරගලය තවත් දිග්ගැස්සුණි. ජාතික සමගිය ගොඩ නැංවීම සඳහා ක්‍රි.ව. 1921 දී සම්මේලන 02 ක් පැවැත් වූ නමුත් ඒවා ප්‍රතිඵල රහිත වුණි. මේ අතර යුරෝපීය බර්ගර්, ද්‍රවිඩ, මුස්ලිම් හා ඉන්දියානුන් ගේ ඒකාබද්ධ යෝජනා

---

32. K. M. de Silva ; An article on "Constitutioal Reform......" *op-cit* ; 0. 33.
33. K. M. de Silva : An article on "Constitutional Reform an Elective ......" *op-cit*. p. 33.
34. Report on the Special Commission...... *op-cit*. p. 14.

සමූහයක් රාජ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.[35] කොළඹ ද්‍රවිඩ සංගමයද වෙනම ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. මේ සියල්ල සලකා බැලූ ඉංග්‍රීසි රජය ක්‍රි.ව. 1923 දී නව ආංඩුක්‍රම සංශෝධන මාලාවක් ඉදිරිපත් කරන ලදී.[36] මෙම ආංඩුක්‍රමය මැනිංඩොමොන්ෂයර් ආංඩුක්‍රමය ලෙස හැඳින්වේ. ව්‍යවස්ථාදයක සභාව මන්ත්‍රීන් 49 දෙනෙකු ගෙන් සමන්විත වූණි. මෙයින් 12 ක් නිලලත් මන්ත්‍රීන් වූ අතර 37 දෙනෙක් නිලනොලත් අයවූහ. මෙම 37 දෙනාගෙන් 3 දෙනෙක් ඍජු ලෙස බ්‍රිතාන්‍ය රජය හෙවත් ආංඩුකාරයා විසින් පත් කරන ලදී. ඉතිරි 34 දෙනාගෙන් 23 දෙනෙක්ම පත්වූයේ ප්‍රාදේශීය මහජන චන්දයෙනි. මෙම 23 දෙනා පළාත් බද ලෙස චන්දයෙන් තේරී පත්වූයේ මේ අයුරිනි. බටහිර හා උතුරු පළාත් සඳහා 05 දෙනා බැගින් ද, නැගෙනහිර, මැද, වයඹ හා සබරගමු පළාත් සඳහා මන්ත්‍රීන් 02 බැගින්ද, උතුරු මැද හා ඌව සඳහා එක් මන්ත්‍රීවරයකු බැගින් ද දකුණු පලාතට මන්ත්‍රීන් 03 දෙනෙක්ද වශයෙනි. මේ අනුව ලංකාව සර්වජන චන්දය කරා පියනැගී මේ ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙස මෙම ප්‍රාදේශීය චන්දය පෙන්වා දිය හැක. නම් කරන ලද 11 දෙනාගේ සංයුතිය මෙසේය. නාගරික හා ග්‍රාමීය යුරෝපීන් හා වාණිජ පංතිය සඳහා 03 දෙනෙක් ද, බර්ගර් වරුන් සඳහා 02 ක්ද, ඉන්දියානුන් සඳහා 02 ක් ද, මුස්ලිම්වරුන් සඳහා 03 ක්ද, බස්නාහිර පළාතේ ද්‍රවිඩයන් සඳාහා එක් ආසනයක් ද වෙන් කරන ලදී. ක්‍රි.ව. 1924 සිට ක්‍රියාත්මක වූ ප්‍රතිසංස්කරණ වලට අනුව ලංකා ව්‍යවස්ථාදයක සභාව චන්දයෙන් නියෝජනය වූ කවුන්සලයක් ලෙස පිළිගත හැක.[37]

ක්‍රි.ව. 1923 ප්‍රතිසංස්කරණ වලට අනුව ව්‍යවස්ථාදයක සභාවට මන්ත්‍රීන් තේරීම සඳහා චන්දදයකයකු වීමට පහත සඳහන් සුදුසුකම් අවශ්‍ය වූණි.[38] සුදුසුකම් දෙස බලන විට එය ඉතාමත් සීමිත චන්ද ක්‍රමයක් බව පැහැදිලිවම පෙනී යයි. ක්‍රි.ව. 1924 චන්දය දීමට සුදුස්සන් වූයේ පහත සඳහන් අයයි.

1. බ්‍රිතාන්‍ය පුරවැසියකු වීම.[39]
2. වයස 21 ට වැඩි පිරිමියකු වීම.
3. සිංහල, දෙමල හෝ ඉංග්‍රීසි ලිවීමට හා කියවීමට හැකියාව ඇති අය.
4. චන්ද ලැයිස්තු සකස් කරන විට අඩු වශයෙන් මාස 6 කාලයක් අදාළ කොට්ඨාශයේ පදිංචිය ඔප්පු කළ හැකි අය.
5. වාර්ෂික ලෙස රුපියල් 600 ක ස්ථිර ආදායමක් ඇති අය.
6. අදාළ කොට්ඨාශයට අයත්ව, උගස් බදු ණය කපා හැරීමෙන් පසු රු. 1,500/-ක් වටිනා නිශ්චිත දේපල වලට හිමි කම් කිය හැකි අය.
7. නගරසභාවල ජීවත් වන්නේ නම් රු. 400 කට නොඅඩු වාර්ෂික වටිනාකමක් ඇති ගෘහයක පදිංචි අය, ග්‍රාමීය ලෙස නම් රු. 200 කට නොඅඩු වාර්ෂික වටිනාකමක් ඇති ගෘහයක පදිංචි අය. (ඉහත සඳහන් දේපල මාරු කරගත හැකි වුවත් එය ඒ ඒ කොට්ඨාශ තුළම සිදුවිය යුතුය.)
8. මරණ දඬුවම ලැබූවකු හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම ලැබූවකු නොවිය යුතුය.
9. මානසික රෝගීන් නොවන අය.

---

35. Report of the Special Commission......... *op-cit.* p. 15.
36. *Ibid.* p. 16.
37. K. M. de Silva: An article on" Constitutional Reform and Elective..." *op-cit.* p. 40.
38. Report of the Special Commission ...... *op-cit.* pp. 80-02
39. එකල සියළුම ලාංකිකයින් බ්‍රිතාන්‍ය කිරීටයට අයත් පුරවැසියන් ලෙස සැලකුනි.

ක්‍රි.ව. 1924 චන්දය සඳහා මන්ත්‍රීධුරාපේක්ෂකයෙකු වීම් සඳහා පහත සඳහන් සුදුසුකම් අවශ්‍ය වූණි.[40]

1. බ්‍රිතාන්‍ය පුරවැසියකු විය යුතුය.
2. රජයේ සේවකයකු නොවිය යුතුය.
3. වයස අවු. 25 ට වැඩි විය යුතුය.
4. ඉංග්‍රීසි භාෂාව කියවීමටත්, ලිවීමටත්, කථා කිරීමටත් හැකියාව තිබිය යුතුය.
5. රු. 1,500/- ට වැඩි වාර්ෂික ආදායමක් ලබන්නකු විය යුතුය.
6. ඉඩම් අයිතිය ලෙස රු. 5,000/- ක්[41] වටිනා ස්ථිර දේපල හිමි අයකු විය යුතුය.
7. නගරයක වාසය කරන්නේ නම් වාර්ෂික ලෙස රුපියල් 500/-ක් වටිනා ගෘහයක පදිංචි වී සිටිය යුතුය.

   ග්‍රාමීය ලෙස නම් වර්ෂයකට රු. 400/- ක් වටිනා ගෘහයක පදිංචි වී සිටිය යුතුය.

ක්‍රි.ව. 1924 සිට ක්‍රියාත්මක වූ රෙගුලාසි වලට අනුව ක්‍රි.ව. 1924 දී ලංකාවේ චන්ද බලය හිමිවූයේ 2,04,997[42] දෙනෙකුට පමණි. එය ලංකාවේ මුළු ජනගහණය වූ 50 ලක්ෂයෙන් 4% ක් පමණි. මේ තත්ත්වය යටතේ ගොවීන් හා කම්කරුවන් මෙන්ම ස්ත්‍රීන්ද චන්දයට හිමිකම් නොකීහ. ලංකා කොංග්‍රස් සාමාජිකයින් මේ තත්ත්වය අවබෝධ කර ගැනීමට මහන්සි වී නැත. ඒ නිසාම ඔව්හු මීට වඩා පුළුල් චන්ද බලයක් නොඉල්ලූ අතර සර්වජන චන්දයට අනුමැතිය ද නොදුන්හ.[43] සමකාලීන ද්‍රවිඩ නායකයින්ද මේ මතයම දැරූහ. ලංකාවට පුළුල් චන්ද ක්‍රමයක් මුල්වරට ඉල්ලා සිටියේ, 1919 දී ඉංග්‍රීසි ජාතික පියතුමකු වන ඒ. ජේ. ෆ්‍රේසර් (Fraser)[44] ය. ත්‍රිත්ව විද්‍යාලයේ විදුහල්පති වූ මොහු වගකීම් සහිත රාජ්‍යයක් සඳහා පුළුල් චන්ද ක්‍රමය අවශ්‍ය බව කියා ඇත. මෙයට මාස කිහිපයකට පසු සර් පොන්නම්බලම් අරුණාචලම් ඒ. ජේ. ෆ්‍රේසර් (Fraser) පියතුමාගේ අදහස අනුමත කරමින් පුළුල් චන්ද ක්‍රමයක් ලංකාවට අවශ්‍යයයි. ප්‍රසිද්ධ රැස්වීම් 2 කදී ප්‍රකාශ කර ඇත.[45] ඉන්පසුව ක්‍රි.ව. 1923 දී ලංකා කම්කරු බල වේගයේ නායකයා වූ ඒ. ඊ. ගුණසිංහ සෑම වැඩිහිටි පුරවැසියකුටම චන්ද බලය ඉල්ලා ඇත. මෙය තමාගේ දේශපාලන බලය දියුනු කර ගැනීමට ඔහු දැරූ උත්සාහයක් ලෙස පිළිගැනීමට ද පුලුවන, ඒ සමගම ව්‍යවස්ථාදායක සභාවේ සිටි බ්‍රිතාන්‍ය ජාතියකයකු කියා සිටියේ වයස 25 ට වැඩි සියළුම පිරිමින්ට චන්ද බලය දිය යුතු බවයි.[46] නමුත් ස්ත්‍රීන්ගේ චන්ද බලය ගැන කථාකළ කිසිවකු දක්නට නොලැබුණි. මේ අනුව පැහැදිලිව පෙනෙනුයේ ජාතිවාදී සිංහල හා ද්‍රවිඩ නායකයින් රටේ ජනගහණයෙන් වැඩි කොටසක් නියතයෙන්ම අයින්කර සකස් කරන ලද චන්ද සංඛ්‍යාවක් මත පදනම් වූ ව්‍යවස්ථාදායක සභාවකින් සම්පූර්ණ වගකීම් සහිත රාජ්‍යයක් බලාපොරොත්තු වූ වගයි.[47]

---

40. Report of the Special Commission...... *op-cit*. p. 16.
K. M. de Silva : An article on" "Constitutional Reform and Elective..." *op-cit*. p. 40.
41. මහාචාර්ය කේ. ඇම්. ද සිල්වා මෙය රු. 6,000/- ලෙස දක්වයි. (An article on "Constitutional Reform and Eletive ......" *op-cit*. p. 40.) නමුත් ඩොනමෝර් වාර්තාව දක්වන්නේ රු. 5,000 කි.
42. The Report of the Special Commission, op-cit, p. 82.
43. Report of the Special Commission...... *op-cit*. p. 82.
44. K. M. de Silva: An article on"Introduction of Universal Suffrage" in the *Universal Franchise* 1931—1981 *The Sri Lankan Experinence*. p. 53.
45. *Ibid*. p. 53.
46. Report of the Special Commision. *op-cit*. pp. 52-83.
47. *Ibid*. p. 83.

20 ශත වර්ෂයේ මුල් භාගයේ ලාංකික දේශපාලනඥයින්ගේ ප්‍රභේද අතර මුල් තැනක් ගත්තේ කුලභේදයයි. ඉංග්‍රීසි පාලකයින් සිතූ අයුරු එකල ලංකාවේ සිංහල ද්‍රවිඩ ගැටුමක් දක්නට නොලැබුණි. එකල ඡන්දය හිමිවූ 4% ක වන්දදයකයින් තුළ ප්‍රභූ වරු, ඉඩම්හිමියන්, උගතුන්, උසස් සමාජ තත්ත්වයක් හිමි වූවන්[48] සිටි අතර ඔවුන් තුළ සිංහල ද්‍රවිඩ ගැටුමක් ඇති කර ගැනීමට තරම් පටු හැඟීම් තිබුනේද යන්න සැක සහිතය. කෙසේ වුවද ක්‍රි.ව. 1924 මහා මැතිවරණය විග්‍රහ කිරීමේදී එය පක්ෂ ක්‍රමය අතර තරඟයකට වඩා ආගම, කුළය, ජාතිය මුල්කොට ගත් තරඟයක් ලෙසද දක්විය හැක.[49] නමුත් ජාතික කොංග්‍රසය ඉහත කී පටු අදහස් නිතරම පිටු දක්නා ලද අතර නිතරම ජාතික සමගිය හා සමෘද්ධිය බලාපොරොත්තු වී ඇත. ක්‍රි.ව. 1924, මැතිවරණ ව්‍යාපාරය ගෙන ගිය ක්‍රියා කලාපය ඇසුරින් ඒ මනාව පැහැදිලිවේ.[50] මෙම මැතිවරණයේදී ඔවුන් කුළ ක්‍රමය පිටු දැකීමට බොහෝදුරට උත්සාහ කර ඇති අතර උඩරැටියන් පෙන්වීමට උත්සාහ කළ සුළුජාති ව්‍යාපාරයටද අනියම් ලෙස පහර ගැසීමට ඔවුන් උත්සාහ කර ඇත.

ක්‍රි.ව. 1926—28 වකවානුවේදී ලංකාවේ සමීක්ෂණයක යෙදුණු ඩොනමෝර් කොමිෂම[51] ලංකාවට සර්වජන චන්දය ලබාදීමෙන් ලංකා සමාජය තුළ විශාල පරිවර්තනය යක් බලාපොරොත්තු වී ඇත. එංගලන්ත වාසීනට ලැබුණු සර්වජන චන්දය හා සංසන්දනය කිරීමේ දී ලංකාවට එය ලැබී ඇත්තේ සටන් හා උද්ඝෝෂණ වලින් තොරව ලාංකික දේශපාලනඥයින් එය නොඉල්ලූ අවස්ථාවක, තෑග්ගක් වශයෙනි. එංගලන්ත යේ පිරිමින්ට ප්‍රථම වරට චන්දය හිමිවූයේ ක්‍රි.ව. 1884 දීය.[52] ක්‍රි.ව. 1918 මහජන පණතින් එංගලන්ත වාසි පිරිමින්ගේ සර්වජන චන්දය සහතික කරන ලද අතර එංගලන්ත කාන්තාවන්ගේ දේශපාලන අයිතිය ද පිළිගැනුනි. ඒ අනුව ක්‍රි.ව. 1918 එංගලන්තයේ පිලිගැනුණු චන්ද ක්‍රමය[53] අනුව වයස 21ට වැඩි පිරිමින්ද වයස 30 වැඩි කාන්තාවන්ද, වයස 19ට වැඩි යුධභටයින් ද චන්ද බලය සඳහා හිමිකම් කීහ. නමුත් ක්‍රි.ව. 1928 දී වයස 21 ට වැඩි සියළුම ඉංග්‍රීසි කාන්තාවන් චන්ද බලය ලැබීමෙන් පසු ප්‍රථම වරට සර්වජන චන්දය මත මහා මැතිවරණයක් එංගලන්තයේ පවත්වනු ලැබුවේ ක්‍රි.ව. 1928 වර්ෂයේදී ය.[54]

ඩොනමෝර් කොමිෂම ලංකාවට සර්වජන චන්දය හඳුන්වා දීමට කැමැති වූ නමුත් ලාංකික දේශපාලනඥයින් බොහෝ දෙනෙක් ඒ ගැන උනන්දු නොවූ බව ඉහත පෙන්වා දෙන ලදී. මේ පිළිබඳව උනන්දුවක් දක් වූ කම්කරු නායක ඒ. ඊ. ගුණසිංහ, ලංකා ජාතික සංගමය ඩොනමෝර් කොමිෂම වෙත කරුණු ඉදිරිපත් කිරීමට ප්‍රථම චන්ද ක්‍රමය පුළුල් කළ යුතුය යන යෝජනාව එම කරුණු වලට ඇතුලත් කිරීමට අවසාන වරටත් ප්‍රයත්නයක් ක්‍රි.ව. 1927 දී දැරූ නමුත් එය ද ව්‍යර්ථ වුණි.[55] ඩොනමෝර් කොමිෂම වෙත කරුණු දැක්වීමට ගිය ලංකාව ජාතික කොංග්‍රසයේ නියෝජිතයින් වූ ඊ. ඩබ්ලිව්. පෙරේරා, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක සහ ආර්. එස්. එස්. ගුණවර්ධන එහිදී චන්ද ක්‍රමය පිළිබඳව කථා කිරීමෙන් වැලකුහ.[56] නමුත් චන්ද ක්‍රමය ගැන ප්‍රශ්නයක්

---

48. K. M. de Silva :"An article on" Constitutional Reform and Elective." *lop-cit*. p. 40.
49. *Ibid*. p. 43.
50. *Ibid*. pp. 40—45.
51. සභාපති ඩොනමෝර් සාමිවරයා සෙසු සාමාජිකයින් වූයේ භර් මැතිව් කාෂන්, සර් ජෙෆ්රි බට්ලර් වෛද්‍ය ටී. ඩ්‍රමන්ඩ් ෂිල්ස්, ජී. ඒ. ක්ලට්ර්බක් (ලේකම්) සහ ඩබ්ලිව්. ජී. බාර්ට්ලි (භාණ්ඩාගාරික)
52. K. M. de Silva : An article on "Introduction of Universal Suffrage" *op-cit*. p. 52.
53. K. M. de Silva: An article on "Introduction of Universal Suffrage..." *op-cit*. p. 52.
54. *Ibid*. p, 52.
55. *Ibid*. p. 52.
56. *Ibid*. p. 52.

මතු වූ අවස්ථාවේදී ඔවුන් වාචිකව කියා සිටියේ මාසිකව රු. 50 ක ආදායමක් ලබන අයත් වයස 25 ට වැඩි කාන්තාවන්ටත් චන්දය හිමිවිය යුතු බවයි. නමුත් මෙය දේශපාලන ඉල්ලීමක් ලෙස ලිඛිතව තම යෝජනාවලට ඔවුන් ඇතුළත් නොකළහ.

ජනතාවගේ සම්පූර්ණ නියෝජනයක් නොමැතිව ලංකාවට වගකීම් සහිත ආංඩු ක්‍රමයක් ලබාදීමට මැලි වූ ඩොනමෝර් කොමිෂම ලංකාණ්ඩු ක්‍රමය පිළිබඳව ලාංකිකයින් සතු වගකීම වැඩි කිරීමට වඩා ලාංකිකයින්ගේ චන්ද බලය පුළුල් කිරීම වඩා අවශ්‍ය බව පහත සඳහන් කරුණු මත සනාථ කළහ.[57] ඒ මගින්

(i) ලාංකිකයින්ගේ දුගී භාවය මගහැරවීම.

(ii) කර්මාන්තශාලා අණපණත් පුළුල් කිරීම, කර්මාන්ත ශාලාවල සේවාකාලය හා වැටුප් පාලනය කිරීම, සහ කම්කරු චන්දි ගෙවීමට සුදුසු විධි විධාන වලට මග පෑදීම.

(iii) සමාජමය හා කාර්මික අණපණත් දියුණු තත්ත්වයකට පත් කිරීම.

(iv) පීතෘමූල රදල ආංඩුක්‍රම වලින් පීඩිතවූ ගැමි ජනතාව මුදා ගැනීම.

(v) සමාජයේ තිබූ විවිධ පංති වලට හා කුළභේදයට පහර ගැසීම.

(vi) රටේ සෑම වැසියාටම දේශපාලන අවබෝධය ලබාදීම.

(vii) එමගින් රටේ ආංඩුක්‍රම දියුණුවක් ඇති කිරීම.

චන්ද බලය පුළුල් කිරීමෙන් දූෂණ ඇතිවේය යන තර්කය කොමිෂම විසින් බිඳ දමන ලදී. චන්ද දායකයින් වැඩි වන විට දූෂණ අඩුවෙනවා පමණක් නොව ඔවුන් සිතු පැතූ අන්දමට හැසිරවීමද දුෂ්කරවේ. එංගලන්තයේ පුළුල් චන්ද ක්‍රමය නිසා ක්‍රි.ව. 1931 වනවිට දූෂණ සම්පූර්ණයෙන්ම පාහේ ඉවත්ව ඇතැයි ඩොනමෝර් කොමිෂම පෙන්වා දුනි.[58]

සර්වජන චන්දය යෝජනා කළ ඩොනමෝර් කොමිෂම චන්දදායකයෙකු වීම සඳහා පහත සඳහන් සුදුසුකම්[59] ඉදිරිපත් කරන ලදී. මෙහිදී කාන්තාවන්ගේ චන්ද බලය පමණක් වයස 30 දක්වා සීමා කර ඇත.

(i) බ්‍රිතාන්‍ය පුරවැසියකු වීම.

(ii) වයස 21 ට වැඩි පිරිමින් හා වයස 30 වැඩි ස්ත්‍රියක වීම.

(iii) වර්ෂ 5 ක කාලයක් තුළ දිවයිනේ පදිංචිව සිටීම.

(iv) චන්ද ලැයිස්තු සකස් කිරීමට ප්‍රථම මාස 6 තුළ චන්ද කොට්ඨාශයේ පදිංචි වීම.

(v) මරණ දඬුවමට හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවමට හසු නොවීම.

(vi) මානසික රෝගියකු නොවීම.

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයකු වීම සඳහාද ඉහත කී සුදුසුකම් වලංගුවේ. නමුත් මන්ත්‍රීවරයකු වීම සඳහා ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීනත්වය ලබා තිබිය යුතුය. මැතිවරණයකදී අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත්වන අය ඇප මුදලක් තිබිය යුතු අතර මුළු චන්ද, සංඛ්‍යාවෙන් කිසියම් ප්‍රතිශතයක් නොලැබුණිනම් එම ඇප මුදල රාජසන්තක වුනි.

---

57. Report of the Special Commission *op-cit*. p. 83.
58. Report of the Special Commission *op-cit*. pp. 53—84.
59. *Ibid*. pp. 83—84.

ක්‍රි.ව. 1931 ට පෙර පැවැති මැතිවරණ වලදී දේපල හා ආදයම සුදුසුකම වැදගත් තැනක් ගත් අතර දැන් එය වටිනාකමින් තොර එකකැයි කොමසාරිස්වරු පෙන්වූහ.[60] දේපල අයිතියක් තිබීමෙන් ඒ දේපල පිහිටා ඇති රට කෙරෙහි ද අයිතියක් ඇති බවත් එය රටේ ස්ථාවරභාවය රැක ගැනීමට උපකාරී වන බවත් පිළිගැනේ. ඒ හැර රටේ නීත්‍යානුකූල අධිකාරිය පිළිගැනීමක් ද ඒ මගින් සිදු වේ. නමුත් දේපල අයිතිකරුවකුට වඩා කිසිම දේපලක් නොමැති වැදගත් රටවැසියකු කෙරේ රටේ නීත්‍යානුකූල අධිකාරියේ හොඳ නොහොඳ බලපාන බවත්, ඔහුව පාලනය කරන පාලකයින් තේරීම පිළිබඳව අඩුවශයෙන් සමාන අයිතිවාසිකමක් වත් ඔහුට තිබිය යුතු යයි දැක්වූ ඩොනමෝර් තර්කයෙහි වැදගත් සත්‍යයක් ගැබ්ව ඇත.[61]

ක්‍රි.ව. 1931 ට පෙර රුපියල් 50 මාසික ආදායම (වාර්ෂික ව රුපියල් 600 ක් ) ඡන්ද බලය ලැබීමට සුදුසුකම වුණි. නමුත් එකල බොහෝ කම්කරුවන්ගේ මාසික වැටුප වූයේ රු. 15 සිට රු. 20 දක්වා සුළුගණනකි. මීට අමතරව ගොවින්ගේ ආදායම තක්සේරු කිරීම ද අපහසු විය. ඔවුන්ද මාසිකව රු. 50 ක් ලැබීයයි සිතීම අපහසුය. මේ අතර කුළහීන පංතීන් ලැබුවේ නාම මාත්‍රික ආදායමකි. ලංකාවේ පැරණි ඉතිහාසයෙහි ගම්සභා ක්‍රමයෙහි සභිකයින් තෝරනු ලැබුවේ ඡන්ද ක්‍රමයෙන් නිසා, ගම්වැසි වැඩිහිටි අයට ඡන්ද බලය පිළිබඳව පුහුණුවක් තිබුණි.[62] මේ තර්කය මත මුදල් ආදායම ඡන්ද බලයට සුදුසුකමක් නොවිය යුතු යයි කොමසාරිස්වරු පෙන්වා දුන්හ.

ක්‍රි.ව. 1931 ට පෙර බුද්ධිමත් ඡන්දදායකයින් පමණක් ඡන්දය දීමට සුදුස්සන් යයි පිළිගැනුනි. මෙම තර්කය ගෙන එනු ලැබුවේ බොහොදුරට සුළුජාතීන් විසිනි. ද්‍රවිඩ, බර්ගර් හා යුරෝපීය යන ජන කොටස් සිංහලයින්ට වඩා අධ්‍යාපනය අතින් දියුණුව සිටීම මෙයට හේතුවයි.[63] අඩුම වශයෙන් කිසියම් භාෂාවක් කියවීමට හැකියාව තිබිය යුතු යයි කී ඔවුන් ඡන්දපත්‍රිකාවක් හෝ පුවත්පතක් කියවා තේරුම් ගැනීම ඡන්දය පාවිච්චි කිරීමේදී වැදගත් බව කියා සිටියහ. ගම්කාරක සභාවල ඡන්දය දීමේ දී එවැනි අධ්‍යාපන සුදුසුකමක් අවශ්‍ය නැතැයි කී ඔවුන් ගම්කාරක සභාවල අපේක්ෂකයින්ගේ දක්ෂතා හා චරිතය පිළිබඳව ගම්වැසියනට හොඳ අවබෝධයක් තිබුණ බවද කීහ. මේ නිසා ගම්කාර්ය සභාවලට අධ්‍යාපන සුදුසුකම අනවශ්‍ය වුවත් මහාමැතිවරණයක දී එය අත්‍යවශ්‍ය යයි සුළුජාතීන් පෙන්වා දුන්හ. මෙම තර්කවලට ප්‍රතිවිරුද්ධ අදහස්ද එකල දැක්වුණි.[64] එනම්—

(i) කියවීමට ඇති හැකියාව දේශපාලනය පිළිබඳ දැනුම පිළිබිඹු නොකරන බව

(ii) කියවීමට නොහැකි සාමාන්‍ය දැනුමක් ඇති ගම්වැසියා කියවිය හැකි නගරවාසී අල්ප බුද්ධියක් ඇති බොහෝ දෙනාට වඩා කාරණා කාරණ දන්නා බව. මෙයින් අදහස් වන්නේ නගරවාසීන්ට වඩා ගම්වාසීන් මිනිසුන් මැනීම අතින් හොඳබවයි.

(iii) පුවත්පත් වලින් හා ඡන්ද පත්‍රිකා වලින් වැරදි අදහස් ප්‍රචාරය කළ හැකි නිසා ඒවා කියවීමට හැකිවීම තර්කයක් නොවීම.

(iv) ජාතික ප්‍රශ්න පිළිබඳ අවබෝධය සාකච්ඡා කිරීමෙන් හා කල්පනා කිරීමෙන් ලබා ගත හැකි වීම.

---

60. Report of the Special Commission...... *op-cit*. p. 84.
61. *Ibid*. pp. 84—85.
62. *Ibid*. pp. 84—85.
63. Report of the Special Commission......*op-cit*. p. 85.
64. *Ibid*. p. 85.

මේ සියළුම ප්‍රතිපාක්ෂික හා ප්‍රතිවිරුද්ධ තර්ක එද රටේ තත්ත්වය සමඟ හොඳින් පරීක්ෂා කිරීමට කොමසාරිස්වරු වග බලාගත්හ. ක්‍රි.ව. 1931 අධ්‍යාපන අධ්‍යක්ෂකගේ වාර්තාවට අනුව දිවයිනේ බාලපරපුරෙන් 45% කිසිම අධ්‍යාපනයක් නොලැබූ අයවේ. කොළඹ නගරය තුළම දහස් ගනණක් දරුවන් පාසැල් නොගියහ. මේ නිසා අධ්‍යාපන සුදුසුකම් චන්ද බලයට යොදු ගතහොත් දහස් ගණනක් සාමාන්‍ය වැසියාට තමාගේ සිවිල් අයිතිවාසිකමට අහිමි කරුවන් වන බව කොමිෂම පෙන්වා දුනි.[65] අධ්‍යාපනය ලැබීමට අවස්ථාව නොලැබීම ගැන ඔවුන්ට වරද පැවරිය නොහැක. මෙහිදී කොමිෂම ඉතා ප්‍රගතිශීලි ලෙස ලංකාවේ සාමාන්‍ය බහුතර ජනතාව ගැන සළකා ඇත.

ද්‍රවිඩ ජනතාවගෙන් 80,000 ක් පමණ කුළහීන හෝ හරිජන කොටස් වශයෙන් ක්‍රි.ව. 1931 දී වෙන් කරනු ලැබීය. චන්ද බලය ලබා ගැනීමෙන් ඔවුන්ට තමන්ගේ තත්ත්වය දියුණු කළහැකි යයි ඩොනමෝර් කොමිෂම කල්පනා කරන ලදී. රටේ පුරවැසිභාවය පිළිබඳව ආත්ම විශ්වාසයක් ද එමගින් ඔවුනට ලැබෙනු ඇත. දැඩි අධ්‍යාපන සුදුසුකම යොදු ගතහොත් ඉහත කී කුළහීන පංති වලට දැඩි අසාධාරණයක් සිදුවන බව ඩොනමෝර් කොමිෂම අදහස විය. මිෂනාරි පාඨශාලා වලින් අධ්‍යාපනය ලැබූ කිහිප දෙනෙකු හැර සෙසු බොහෝ කුළහීනයන් අධ්‍යාපනය රහිත වූහ. විශේෂයෙන්ම උසස් කුළ (වෙල්ලාල) වලට අයත් දරුවන් සමඟ කුළහීන දරුවන්ට පාසැල් යාමට අවහිරතා තිබීම මෙයට හේතුවයි. සිංහලයින් අතරත් මෙම කුළභේදය තිබුණු නමුත් ද්‍රවිඩ ජනකොටස්වල තරම් එය දරුණු නොවීය.[66] ඉන්දීය සංක්‍රමණිකයන් හෙවත් වතු කම්කරුවන්ගේ අධ්‍යාපන තත්ත්වයත් ඉහත කී තත්වයට සමාන වූණි. මෙසේ පහත් යයි සම්මත ජන කොටස්වලට අසාධාරණයක් වන අධ්‍යාපන සුදුසුකම චන්ද සඳහා නොයොදවන බව කොමසාරිස්වරු ප්‍රකාශ කළහ.[67] මේ අතර ක්‍රි.ව. 1831 තෙක් පැවැති අධ්‍යාපන සුදුසුකම ක්‍රියාත්මක වූ ආකාරය ද සාධාරණ නොවීය. මේතාක් කිසිදක අධ්‍යාපනය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා නැති අතර ගම්මුලාදැණීන්ට කැමැති පරිදි චන්දදායක නාම ලේඛන සකස්කරනු ලැබීය. තවද සිංහල භාෂාවේ ලියන අන්දමේ හා කියවීමේ වෙනසක් ඇති බැවින් අධ්‍යාපන පරීක්ෂණ පැවැත්වීම නුසුදුසු යයි කොමිෂම අදහස් කර ඇත. ඉහත කී කරුණු සියල්ල සලකාබැලූ ඩොනමෝර් කොමිෂම, වගකීම් සහිත ආංඩුවක් වර්ධනය වීම සමඟ එම ආංඩුව කෙරෙහි බලපෑමට සාමාන්‍ය වැසියාට ඉඩ ප්‍රස්තාව දිය යුතු යයි කල්පනා කරන ලදී. චන්දබලය උගත් පංතියට සීමා නොකළ යුතු යයි කී කොමිෂම, රටේ සෑම දරුවකුටම අධ්‍යාපනය ලබාදීම ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීන්ගේ වගකීමක් බව පෙන්වා දුනි.[68] දිවයිනේ පාඨශාලා සහ ගුරු අභ්‍යාස විද්‍යාලවල තත්ත්වය හා සංඛ්‍යාව දියුණු කර පුහුණු ගුරුවරු මගින් රටේ අධ්‍යාපනය දියුණු කළ පසු ඉහතකී අධ්‍යාපන සුදුසුකම චන්ද බලය සඳහා කිසිසේත් බල නොපානු ඇතැයි ඩොනමෝර් කොමිෂම ප්‍රකාශ කර ඇත. මෙහිදී කොමිෂම ඉතාමත් ප්‍රගතිශීලි අයුරින් ක්‍රියාකර ඇති බව තර්කයෙන් තොරව පිළිගත හැක.

ඩොනමෝර් කොමිෂම තම යෝජනා වලින් ස්ත්‍රීන්ට චන්ද බලය සීමා කර ඇත. වයස 21 ට වැඩි පිරිමින්ට දුන් වරප්‍රසාදය ස්ත්‍රීන්ගෙන් වයස 30 වැඩි අයට පමණක් ලැබුණි. මෙය පූර්ණලෙස සර්වජන චන්දය ලැබීමක් ලෙස පිළිගත නොහැක. වයස 30 ට වැඩි ස්ත්‍රීන්ට චන්ද බලය ලබා දීමට, එංගලන්තයේ ස්ත්‍රී චන්ද බලය පිළිබඳ

65. Report of the Special Commission......*op-cit*. p. 85.
66. *Ibid*. p. 86.
67. *Ibid*. p. 86.
68. The Report of the Special Commission......*op-cit*. pp. 86-87.

උද්ඝෝෂණ ව්‍යාපාරයේ මූලිකයෙකු වූ එසේම කොමිෂමේ සාමාජිකයෙකු වූ වෛද්‍ය ඩ්‍රමොන් ෂීල්ස්[69] (Drummond Shiels) විශේෂ සැලකිල්ලක් දක්වා ඇත. මෙහිදී ඩොනමෝර් කොමිෂම පහත සඳහන් කරුණු විශේෂ සැළකිල්ලට ගෙන ඇත්තේ චන්දය පුළුල් කිරීම සඳහා ය.[70]

(i) ස්ත්‍රීන් හා පුරුෂයින් අතර සමානාත්මතාවය.

(ii) ස්ත්‍රීන්ගේ විවිධ ප්‍රශ්න ගැන සළකා බැලීම.

1. දිවයිනේ අධික ළදරු මරණ.
2. ළදරු ශුභ සාධක කටයුතු
3. ළදරු උපත් වලට ප්‍රථම සේවා කටයුතු
4. හොඳ නිවාස ලබාදීම.
5. වින්නඹු සේවාවේ වර්ධනය.

(iii) මේ වන විට ඉන්දීය කාන්තාව චන්ද බලය ලබාතිබීම.

ඉහත කී කරුණු කොමිෂම වෙත ඉදිරිපත් කරන ලද්දේ "කාන්තාවන්ගේ චන්දය පිළිබඳ සංගමය" විසිනි. (Women's Franchise Union) ලාංකික කාන්තාවන්ට වයස් සීමාව 30 දක්වා සීමා කිරීමට බලපෑ කරුණක් වන්නේ 1924 චන්දදායක සංඛ්‍යාව 1931 දී හදිසියේම ප්‍රගුණවේය යන බියයි.[71] 1924 චන්ද බලය හිමිවූයේ පිරිමි 200,000 කට පමණි. එය 1931 දී 12,00,000 දක්වා වැඩි වුණි. කාන්තාවන්ගෙන් චන්ද බලය හිමි වූයේ 50,000 කට පමණි. සර්වජන චන්දය ලැබුණි නම්, මේ සංඛ්‍යාව දෙගුණ වීමට ඉඩ තිබුණි. මෙම වැඩිවීම කෙරේ කොමිෂම බියවීම කාන්තා චන්දය සීමා කිරීමට හේතුවුණි. ඒ හැර මෙම සීමාව ඇතිකිරීමෙන් පසුකාලයේදී සම්පූර්ණ සර්වජන චන්දය ලබා ගැනීමට ලාංකික කාන්තාව උනන්දු වේයයි කොමිෂම[72] කල්පනා කරන ලදී.

ක්‍රි.ව. 1923 තෙක් ලංකාවේ ස්ත්‍රීන්ගේ චන්ද බලය ගැන උනන්දුවූ සංවිධානාත්මක පක්ෂයක් හෝ ස්ත්‍රීන්ගේ ස විධානයක් හෝ දක්නට නොලැබුණි. මේ නිසා ඒ පිළිබඳව රජය උනන්දු වී නොමැත. එංගලන්තයේ වුවද වයස 30 ට වැඩි ස්ත්‍රීන් චන්ද බලය ලැබුවේ ක්‍රි.ව. 1918 දීය. නමුත් නවසීලන්තයේ කාන්තාව ක්‍රි.ව. 1893 දීත්, ඕස්ට්‍රේලියානු කාන්තාව ක්‍රි.ව. 1901 දීත් චන්ද බලය හිමි කරගෙන තිබුණි.

ක්‍රි.ව. 1906 දී එංගලන්තයේ ස්ත්‍රීන්ගේ චන්ද බලය සඳහා පෙලපාලියක් පවත්වන ලදී. මෙයින් පසු නිරන්තරයෙන් මෙම ඉල්ලීම පාර්ලිමේන්තුවටත් බලපෑම් ඇතිකර වීමට සමත් වුණි. ක්‍රි. ව. 1909 දී ස්ත්‍රීන් සමූහයක් සිරභාරයට පවා ගනු ලැබුවේ මේ සටන සම්බන්ධයෙන්[73] ආහාර වර්ජන ව්‍යාපාරයක් ගෙනයාම හේතුවෙනි. මෙම ව්‍යාපාරයේදී බොහෝදුරට ස්ත්‍රීන්ම තම සටන ගෙන ගිය බව පෙනේ. ක්‍රි.ව. 1910 සහ ක්‍රි.ව. 1911 දී පාර්ලිමේන්තුව මගින් සම්මත කළ පණත් දෙකක් මගින් එංගලන්ත

---

69. Tilake Mettananda: An article on "Votes for Women", in the *Universal Franchise* 1931—1981, *The sri Experience*. p. 72.
70. The Report of the Special Commission......*op-cit*. pp. 53—89.
71. The Report of the Special Commission......*op-cit*. pp. 88—89.
72. Tilake Mettananda : An article on "Votes for Women". *op-cit*.
73. *Ibid*. p. 65.

කාන්තාවට සීමිත චන්ද බලයක් හිමිකර දී ඇත.[74] ලිබරල්වාදීන් ස්ත්‍රී චන්ද බලය තව පුළුල් කළ යුතුයයි කියා සිටි නමුත් එංගලන්ත සමකාලීන පාර්ලිමේන්තුව ඒ පිළිගත් බවක් නොපෙනේ. ක්‍රි.ව. 1913 ජනවාරි 27 දින ස්ත්‍රී චන්දය පිළිබඳව පණතක් එංගලන්ත රජය වෙත දැමීමෙන් පසු ඉංග්‍රීසි කාන්තාවෝ තවත් දැඩි ලෙස රාජ්‍ය විරෝධී වැඩ ආරම්භ කළහ.[75] දේපල විනාශය හා කොල්ලකෑම් පමණක් නොව සිය දිවි නසා ගැනීම් පවා දක්නට ලැබුණි. එමිලි ඩේවිසන් (Emily Davison) ඩර්බි (Derby) තුරඟ තරඟ පිටියේ අශ්වයින් ඉදිරියට පැන සියදිවි නසා ගත්තේ ද මේ ස්ත්‍රී චන්ද අයිතිය ලබා ගැනීම සඳහායි.[76] මෙම තත්ත්වය පාලකයින්ගේ නීති තවදුරටත් තද කිරීමට හේතු වුවත් පොදු මහජනතාව මෙම ව්‍යාපාරය කෙරෙහි කරුණාව දැක්වීම ස්ත්‍රීන් ලත් ජය ග්‍රහණයක් වේ. මෙයින් පසු ක්‍රි.ව. 1918 දී වයස 03ට වැඩි එංගලන්ත කාන්තාව චන්ද බලය ලැබූ අතර 1928 දී වයස 21 ට වැඩි චන්ද බලය හෙවත් පූර්ණ සර්වජන චන්දය ඉංග්‍රීසි කාන්තා/පුරුෂ දෙපක්ෂයම ලැබූහ.

ක්‍රි.ව. 1923 ලංකා කාන්තාවට චන්ද බලය දීම ගැන මුල්වරට කථා කළේ නැගෙණහිර පලාතේ රාජ්‍ය සභා මන්ත්‍රීවරයකු වූ ඊ. ආර්. තම්බිමුත්තුය.[77] චන්ද බලය පිළිබඳ ඇති ස්ත්‍රී පුරුෂ භේදය නැති කළ යුතු යයි ඔහු කීය. මෙහිදී එංගලන්ත යටත් විජිත ලේකම් වූ සර් ඇන්ටනී බර්ට්‍රම් (Sir Anton Bertram) කියා සිටියේ ලංකාවේ පුරුෂ චන්ද බලය තවත් පුලුල් වන තෙක් ස්ත්‍රීන් ඉවසා සිටිය යුතු බවයි.[78] මේ අතර සෙසු ලාංකික දේශපාලනඥයින් මේ පිළිබඳව උනන්දු නොවීම නිසා ප්‍රශ්නය නොවැදගත් වුණි. 1924 වාර්ෂික කොංග්‍රස් සම්මේලනයේදීද මෙයට තැනක් නොලැබුණි.

ක්‍රි.ව. 1925 දී මහනුවර දී පැවැත්වුණු වාර්ෂික කොංග්‍රසයේ සම්මේලනයේදී මල්ලිකා කුලගණ සමිතිය නියෝජනය කළ ඇස්ලින් තෝමස් (Asline Thomas)[79] මහත්මිය ස්ත්‍රීන්ට චන්ද බලය අවශ්‍ය යයි ඉල්ලා සිටින ලදී. මෙම යෝජනාව පිළිගත් කොංග්‍රසය 1926 දී ස්ත්‍රීන්ට සීමා සහිත චන්ද බලයක් රජයෙන් ඉල්ලා සිටින ලදී. ක්‍රි.ව. 1927 දී ඩොනමෝර් කොමිසම ලංකාවට පැමිණි පසු එම වර්ෂයේ දෙසැම්බර් වලදීම කාන්තාවන්ගේ චන්දය පිළිබඳ සංගමය[80] (Women's Franchise Union) කොළඹට සම්බන්ධ

---

74. Tilake Mettananda : "Votes for Women " *op-cit*. p. 66.
75. *Ibid*. p. 66.
76. *Ibid*. p. 66.
77. *Ibid*. p. 66.
78. *Ibid*. p. 66.
79. Tilaka Mettananda : "Votes for Women" *op-cit*. p. 66.
80. මෙහි සභාපතිනිය වූයේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ මව වූ සොලමන් ඩයස් බණ්ඩාරනායක මහත්මියයි. උපසභාපතිවරු දෙදෙනා (1) ඊ. ආර්. තම්බිමුත්තු මහත්මිය (මැයගේ ස්වාමි පුරුෂයා විසින් 1923 මුල් වරට ස්ත්‍රී චන්දබලය පිළිබඳව කථා කර ඇත.) (2) ඩබ්ලිව්. ඒ. සිල්වා මහත්මිය.

    සමලේකම්වරු :

    1. වෛද්‍ය එ. වී. අයියාර් මහත්මිය.
    2. ඇග්නස් ද සිල්වා මහත්මිය
    3. ඩී. ඇම්. ගුණසේකර මහත්මිය.

    භාණ්ඩාගාරික :

    ජෙරාඩ් වීජේකෝන් මහත්මිය.

    සැ.යු. මෙම සංගමයට සම්බන්ධ වූ බොහෝ කාන්තාවන්ගේ ස්වාමි පුරුෂයන් ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීවරු වූහ. සමලේකම් ඇග්නස් සිල්වා මහත්මිය ජෝර්ජ් ඊ. ද සිල්වා මහතාගේ බිරිඳ වූ අතර ඇය ඩොනමෝර් කොමිසම ඉදිරියේ විශේෂ උනන්දුවකින් ස්ත්‍රී චන්දය ගැන කරුණු ඉදිරිපත් කර ඇත.

    (Tilake Mettananda *op–cit*. p. 65.)

කාන්තා සමූහයක් විසින් පිහිටුවා ගන්නා ලදී. මෙම නව කාන්තා සංගමයේ මංගල රැස්වීම 1927 දෙසැම්බර් 09 දින පැවැත්වූ අතර ඩොනමෝර් කොමිෂම වෙත සංදේශ 2 ක් ඉදිරිපත් කළ නමුත් තම නියෝජිතයින් කොමිෂම වෙත යැවීමට කාන්තා සංගමය අකමැති වූහ. සංගමයේ ප්‍රධාන අරමුණු අතර මූල්තැනක් ගත්තේ ලංකාවේ සියළුම කාන්තාවන් එක්සත් කළ යුතුය යන්නයි. මේ හැර ස්ත්‍රී ශුභසාධක කටයුතු පිළිබඳව පිරිමින්ගේ සැලකිල්ල යොමුකරවා ගැනීමත් අරමුණක් වූහ. කෙසේ වුවත් මෙම කාන්තා සංගමයේ ප්‍රධාන පරමාර්ථය වූයේ ලාංකික ස්ත්‍රීන්ට චන්ද බලය ලබා ගැනීමයි. ඒ සඳහා සුදුසුකම ලෙස ඔවුන් සැලකුවේ පාඨශාලා අවසාන සහතිකයයි. (School Leaving Certificate) ඉහත කී මංගල රැස්වීමේ දී ම සංගමයේ නම පහත සඳහන් අයුරින් වෙනස් කරන ලදී.[81] එනම් "ලංකාවේ කාන්තාවන්ගේ චන්ද බලය පිළිබඳ සංගමයයි." (Ceylon Wemen's Franchise Union)

ආරම්භයේදී ඉහත කී කාන්තා සංගමය ඩොනමෝර් කොමිෂම ඉදිරියට යාමට මැලි වූ නමුත් ක්‍රි.ව. 1928 ජනවාරි 11 දින 12 දෙනෙකුගෙන් යුත් කාන්තා දූත පිරිසක් කොමිෂම හමුවේ තම ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී.[82] අඩු වශයෙන් සීමිත චන්ද ක්‍රමයක් හෝ ස්ත්‍රීන්ට ලබා ගැනීම මෙම දූත පිරිසේ අරමුණ විය.

සමකාලීන ලෙස බොහෝ ලාංකික දේශපාලනඥයින් ස්ත්‍රී ඡන්ද බලය ගැන කථා කිරීමෙන් වැලකී සිටිය නමුත් ඊ. ආර්. තම්බිමුත්තු සහ ඒ. ඊ. ගුණසිංහ වැනි දේශපාලනඥයින් ස්ත්‍රී චන්දබලය පිළිබඳව පක්ෂව කථා කළහ. ලංකා ඉන්දියානු සංගමය ස්ත්‍රී චන්ද බලය ගැන පක්ෂව කථා කල නමුත් විවිධ සීමාවන් ඇති කරන ලදී, දේපල හිමිකම, උසස් අධ්‍යාපනය හා අධ්‍යාපනික පරීක්ෂණය[83] එම සීමාවන් වූහ. මෙකල ලංකා කොංග්‍රස් සභාවේ සභාපති වූ ඊ ඩබ්ලිව්. පෙරේරා ද සීමිත චන්ද ක්‍රමයක් ස්ත්‍රීන්ට ලබාදීමට විරුද්ධ නොවීය. ඒ අනුව ලංකා කාන්තාව

(i) වයස 25 ට වැඩි විය යුතුය.

(ii) පාඨශාලා අවසාන සහතිකය (School Leaving Certificate) ස්ත්‍රියට හිමි විය යුතුය,

(iii) රුපියල් 10,000/- ක් හෝ ඊට වැඩි වටිනාකමක් ඇති දේපල වලට ඇය උරුම කිව යුතුය.

මේ අතර ස්ත්‍රී චන්ද බලය ගැන ඍජු ලෙස විරුද්ධතාද දක්නට ලැබීණ[84] ද්‍රවිඩ නායකයකු වූ පොන්නම්බලම් රාමනාදන් කියා සිටියේ ස්ත්‍රීන් ඡන්ද බලය ප්‍රදානය කිරීම නිසා සාමකාමී ගෘහයක පවුලේ කටයුතු අවුල්වෙය යන්නයි. මේ අතර ලංකාවේ ප්‍රභූ පංතිය නියෝජනය කළ සර් මාකස් ප්‍රනාන්දු අනවශ්‍ය වගකීම්වලින් ස්ත්‍රීන් පීඩා නොවිඳිය යුතුය යයි තර්ක කළේය. බර්ගර් ජාතික නියෝජිතයෙකුවූ ජී. ඒ. එච්. විලේ (Wille) රාමනාදන් මහතාගේ අදහස්ම දැරිය. ලාංකික කාන්තාව ජාතික ප්‍රශ්න ගැන සැළකිල්ලක් නැතිවා පමණක් නොව ඔවුන්ගේ කියවීම, ලිවීම හා කථාකිරීම හැකියාව තිබුනේ 21.2%කට පමණ යයි ඔහු කීය. තවදුරටත් තර්කකළ විලේ (Wille) එම ප්‍රමාණයෙන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උගත්කම තිබුනේ 2%කට

---

81. Tilake Mettananda : "Votes for Women" *op-cit* ; p. 60.
82. *Ibisd.* p. 69.
83. *Ibid.* p. 70.
84. *Tilake Mettananda* : "Votes for Women" *op-cit.* p. 70.

පමණයයි කීය. මේ අනුව ස්ත්‍රීන්ගේ චන්දය සඳහා ස්ත්‍රීන්ගේ අධ්‍යාපනය විලේ විසින් වැඩිපුර ඉස්මතු කර දක්වන ලදී. මැලේ වාර්ගික දූත පිරිසේ අදහස වූයේ ස්ත්‍රීන් චන්ද බලය ඉල්ලන්නේ තම තත්ත්වය ආරක්ෂා කිරීමේ අයිතිවාසිකමක් හැටියට බවයි.

මෙම ප්‍රතිවිරුද්ධ තර්ක කෙසේ වුවද ඩොනමෝර් කොමිෂම 1928 දී යෝජනා කළා වයස 30 වැඩි ස්ත්‍රීන්ට චන්ද බලය. අධ්‍යාපන පරීක්ෂණයක් ගැන කොමිෂම කැමැත්ත තිබු නමුත් එහි සාමාජිකයෙකු වූ සර් මැතිව් නාතන් (Sir Mathew Nathan) පුරුෂ යින්ට නොමැති බුද්ධි පරීක්ෂණය ස්ත්‍රීන් වෙනුවෙන් පැවැත්වීම අසාධාරණ යයි කියමින් ඒ ඉවත දැමීය.[85]

ඩොනමෝර් කොමිෂමේ යෝජනා ව්‍යවස්ථාදයක සභාව තුළ ප්‍රසිද්ධියට පත් කළ පසු හදිසියේ ම දිවයිනේ ස්ත්‍රී චන්ද බලය වයස 21 විය යුතු යැයි උද්ඝෝෂණ ඇතිවුණි. මේ අවස්ථාවේදී සර් පොන්නම්බලම් රාමනාදන් වැඩවසම් සමාජ ක්‍රමය ගරු කරමින් ස්ත්‍රී චන්ද බලයට විරෝධය පැවේය. නමුත් ඊ. ආර්. තම්බිමුත්තු කියා සිටියා වයස 30 සීමාව නිසා බොහෝ වැදගත් උගත් ස්ත්‍රීන්ට තම රට වෙනුවෙන් චන්දය පාවිච්චි කළ නොහැකි බව.[86] වයස 21–30 අතර කාන්තාවන්ගේ චන්ද බලය අහෝසි කිරිම ගැන (A. C. G. Wijekoon) ඒ. සී. ජී. විජේකෝන් ද තම කණගාටුව පළකර ඇත.

චන්ද බලය පිළිබඳව ලංකා කාන්තාවන්ගේ සංගමයේ සමලේකම්වරු සංදේශයක් පිළියෙල කර එංගලන්ත යටත් විජිත කාර්යාලයට යවන ලදී. ඔවුන් වයස 21–30 අතර කාන්තාව තුළ ඇති විශිෂ්ට ගුණාංග දක්වන ලදී.[87] මෙම වයසෙහි කාන්තාව අධ්‍යාපනයෙන් දියුණුය. රට ගැන උනන්දුවීමට තරම් කාලය, හා ශ්‍රමය ඇයට ඇත. ඒ හැර මෙම කාලය තුළ ඔවුන් නොයෙක් ප්‍රතිපත්තින්හි යෙදීම ආරම්භ කර ඇත. තවදුරටත් කරුණු දක් වූ සංගමය තර්කයක් වශයෙන් ඉදිරිපත් කළා වයස 30 ට වැඩි ස්ත්‍රියකට වඩා වයස 30 ට අඩු ස්ත්‍රිය දේශපාලනය ගැන උනන්දුවක් දක්වන බවට. ක්‍රි.ව. 1928 ඉදිරිපත්කළ සීමාව නිසා වයස 21–30 ටත් අතර රැකියාවල නියුතු 715,000 පමණ ස්ත්‍රීන්ට තම මානුෂික අයිතිවාසිකම නැති වී යනබව[88] පෙන්වා දී ඇත. මේ අතර මේ කාලය වනවිට රාජ්‍යමන්ත්‍රණ සභාවේ බොහෝ දෙනාද වයස 21 ට වැඩි ස්ත්‍රීන්ට චන්දබලය ලැබීම අගය කළහ. ලංකාවෙන් බාහිර බලවේගයක් වූ "සමාන පුරවැසියන් සඳහා ඇති සමාජයන්හි ජාතික සංගමය" "National Union of Societies for equal Citizenship" ලංකාවේ බිහි වූ කාන්තා චන්ද ක්‍රමයට අදල සංගමය ඉතා සුහදව පිළිගත් අතර ඔවුන් ක්‍රි.ව. 1928 තම වාර්ෂික සම්මේලනයේදී[89] ලංකාවේ කාන්තාවන්ට සර්වජන චන්දය ලබාදිය යුතුයයි එංගලන්ත රජයෙන් ඉල්ලා සිටින ලදී. ඉහත කී සියළුම ඉල්ලීම්වලට කන්දුන් එංගලන්ත යටත් විජිත කාර්යාලය ක්‍රි.ව. 1931 සිට ලංකාවේ වයස 21 ට වැඩි සියළුම ස්ත්‍රීන්ට සර්වජන චන්දය ලාබාදුනි. මෙය ලාංකික කාන්තාවන් ලැබූ විශේෂ වරප්‍රසාදයක් වේ. බටහිර ඉතා දියුණු රටක් වූ ප්‍රංශයේ කාන්තාවට චන්ද බලය හිමිවූයේ ක්‍රි.ව. 1945[90] නිසා ලංකා කාන්තාව දේශපාලන වශයෙන් ක්‍රි.ව. 1931 දී විශාල පියවරක් ඉදිරියෙන් තබා ඇති බව කිව හැක.

---

85. *Ibid.* p. 72.
86. *Ibid.* p. 73.
87. Tilake Mettananda : "Votes for Women" *op-cit*. 73.
88. *Ibid.* p. 73.
89. *Ibid.* p. 74.
90. K. M. de Silva: An article on "The Introduction of Universal Suffrage "*op-cit.* p.52.

ක්‍රි.ව. 1931 මැතිවරණයේද චන්දබලය පුළුල්වීම නිසා චන්දදායක ලියාපදිංචි සංඛ්‍යාව 15,98,610 දක්වා ඉහළ ගියේය. නමුත් දේශපාලනඥයන්ගේ සහ දේශපාලන ක්‍රමයේ ප්‍රධාන වෙනසක් වූ බවක් නොපෙනේ. සර්වජන චන්දය ලැබුණත් ක්‍රි.ව. 1931 පැවැත්වූ මැතිවරණය ක්‍රි.ව. 1924 මැතිවරණයට බොහෝදුරට සමානබව පෙනේ.[91] ක්‍රි.ව. 1924 දී පමණක් නොව ක්‍රි.ව. 1931 මෙන්ම ක්‍රි.ව. 1936 මැතිවරණයේදීත් දේශපාලන පක්ෂවල පිබිදීමක් දක්නට නොලැබුණි. ක්‍රි.ව. 1931 මැතිවරණයේදී මන්ත්‍රීධූරාපේක්ෂකයෝ කොංග්‍රස් (Congress) ලිබරල් (Liberal) ලීග් (League) සහ ලේබර් (Labour) යන නම් වලින් ලේබල් පැළඳගෙන තරග කළ නමුත් පක්ෂ අතර තරගයක් තිබූ බවක් නොපෙනේ. බොහෝ චන්ද කොට්ඨාශවල තරග වැදුනේ කොංග්‍රස් අපේක්ෂකයින්මය. මෙසේ නියම ලෙස පක්ෂ අතර තරඟයක් නොතිබුණු නිසා ක්‍රි.ව. 1931 දීත් කුළය, හා ආගම ප්‍රාදේශීය මැතිවරණයේ ප්‍රධාන තැනක් ගනු ලැබීය.[92] ක්‍රි.ව. 1924 දී මෙන් නොව ක්‍රි.ව. 1931 චන්දය හිමි වූ බහුතරය අධ්‍යාපනයකින් තොර අය වූහ. තම අපේක්ෂකයා නමින් හඳුනා ගැනීම ප්‍රශ්නයක් වූ බැවින් තරඟ කරුවන් සඳහා පාට යොදා ගන්නා ලදී. එක් එක් පාටින් චන්ද පෙට්ටි ලකුණු කර තිබීම නිසා[93] ඔවුන්ට චන්දය දීම පහසුවූ අතර අල්ලස් හා වෙනත් දූෂන විශාල වශයෙන් දක්නට ලැබුණි. මේ අනුව ඩොනමෝර් කොමිෂම බලාපොරොත්වූ දෙය ඉටුවී නැත. මේ හැර අධ්‍යාපන සුදුසුකම චන්දය සඳහා බාධාවක් ලෙස ඔහු නොසැලකුවත් අධ්‍යාපනයේ අවශ්‍යතාවය ක්‍රි.ව. 1931 මහා මැතිවරණයේ දී කැපී පෙනුනි. ඒ කෙසේ වුවත් බහුතර සංඛ්‍යාව ක් තම රටේ දේශපාලන ක්‍රමය ගැන උනන්දු වීමක් දක්නට ලැබුණ නිසා සර්වජන චන්දයේ අගය සියළුදෙනාටම පැහැදිලි වූ බව කිව යුතුය. ක්‍රි.ව. 1931 මැතිවරණයේ දී බොහෝ ආසන සඳහා තරඟ ඇති වූ අතර නිතරගයෙන් පත්වූවන්ද වූහ. අනුරාධපුර චන්ද කොට්ඨාශයෙහි තමා සමඟ තරගකළ සිංහලයා පරදවා ජය ගැනීමට එච්. ආර්. ප්‍රිමන් (Freeman)[94] නම් ඉංග්‍රීසි සිවිල් සේවකයාට හැකි වූයේ ඔහු එහි ජනතාවගේ සිත් දිනාගෙන සිටි බැවිනි. ඩොනමෝර් කොමිෂම වාර්ගික නියෝජනය හැකි තරම් සීමා කර ප්‍රාදේශීය චන්ද පුළුල් කළ නිසා එයට විරුද්ධ වූ ද්‍රවිඩ ජනතාව, තම විරෝධය පෑමක් වශයෙන් 1931 මහා මැතිවරණයේදී උතුරේ ආසනවලට තරඟ නොකර වර්ජනය කළහ. 1934 දී හිස් වූ ආසන සඳහා අතුරු මැතිවරණ පවත්වන ලද අතර ජී. ජී. පොන්නම්බලම් ඒ තුලින් රාජ්‍ය මන්ත්‍රණසභාවට තේරී පත්වුණි. 1936 මහා මැතිවරණයේදී ලිබරල් හාලීග් යන පක්ෂ 2 අතුරුදහන් වී තිබුණු අතර 1935 දෙසැම්බර් වලදී පිහිටුවනු ලැබූ සමසමාජ පක්ෂයට මේ වනවිට කම්කරු පක්ෂයත් සම්බන්ධ වී තිබුණි.[95] නමුත් නියම පක්ෂ ක්‍රමයන් අතර මැතිවරණයක් ක්‍රි.ව. 1936 දීත් නොපැවැත්වුනු අතර පුද්ගලිකත්වය, ආගම හා කුළය තවදුරටත් වැදගත් කොට සැළකුණි. දකුණු කොළඹ ඉතා උගත් මධ්‍යම පංතික චන්ද කොට්ඨාශයක් ලෙස සැළකුණු නමුත් ක්‍රි.ව. 1936 මැතිවරණයේදී ආගම මූලික උපහරණය වුණි. හොරණ ඊ. ඩබ්ලිව්. පෙරේරා පරාජය වූයේ ආගම නිසාය.[96] මීට අමතරව එහි දී කහපාට බුද්ධාගමට අදල පාටක් නිසා පාටද පෙරේරා මහතාගේ පරාජයට බලපාන ලදී. මේ අනුව ඩොනමෝර් බලපොරොත්තු වූ තත්ත්වය ක්‍රි.ව. 1931 හා ක්‍රි.ව. 1936 මැතිවරණ වලින් පිළිබිඹු වී නැත. ක්‍රි.ව. 1936 දීත් 7

---

91. K. M. de Silva: An article an "The Introduction of Universal Suffrage" *op-cit*. p. 54
92. *Ibid*. p. 54.
93. *Ibid*. p. 55.
94. නිතරගයෙන් තේරී පත්වූවෝ 9 දෙනෙකි. සර්. ඩී. බී. ජයතිලක, ඩී. එස්. සේනානායක සහ එස්. ඩබලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ඇතුළු තවත් සිංහලයින් 5 දෙනෙක් සහ හැටන් ආසනයේ ඉන්දීය මන්ත්‍රීවරයා නිතරගයෙන් පත්වූහ.
95. K.M. de Silva: An article on "The Introduction of Universal Suffrage" *op-cit*. p. 56.
96. K. M. de Silva : The Introduction of Universal *op-cit*. p. 57.
97. *Ibid*. p. 57.

දෙනෙකු නිතරගයෙන් පත් වී ඇත.[98] සිංහලයින් 5 දෙනෙක් ද ද්‍රවිඩ ජාතිකයෙක් ද එක් ඉංග්‍රීසි ජාතිකයෙක් ද (එච්. ආර්. ප්‍රීමන් (Freeman) අනුරාධපුරයෙන් පත්වුණි. ක්‍රි.ව. 1936 මැතිවරණයේදී කැපී පෙනුනු ලක්ෂණයක් වූයේ ගොවිගම කුළයට අයත්වූවන්. සැහෙන කොටසක් පරාජය වීමත්, ලංකාවේ පක්ෂ ක්‍රමයට එක්තරා පිබිදීමක් ඇති වීමත්ය. ක්‍රි.ව. 1936 චන්දදායක ලියාපංදිචි සංඛ්‍යාව 24,51,353 ක් [99] නිසා තවදුරටත් අධ්‍යාපනයෙන් තොර චන්දදායිකන් දක්නට ලැබුණි. මේ නිසාම තවදුරටත් මන්ත්‍රීධූරාපේක්ෂකයින් සඳහා පාට වෙන්කිරීම සිදුවුණි. එය ඩොනමෝර් ගේ බලාපොරොත්තු වලට පහර වැදීමකි.

ඩොනමෝර් කොමිෂම ලංකාවට සර්වජන චන්දය හඳුන්වාදීමේ අනියම් ප්‍රතිඵලය වූයේ දේශපාලන පක්ෂ ක්‍රමයක් දිවයින තුළ බිහිවීමයි. එංගලන්තයේ දේශපාලන පක්ෂ ක්‍රමය ක්‍රි.ව. 1884 දී ආරම්භ වූ අතර ඉන්දියාවේ එය ක්‍රියාත්මක වූයේ 1920 සිටයි.[100] ලංකාවේ නියම දේශපාලන පක්ෂ ක්‍රමයෙක් මත මහා මැතිවරණය පැවැත්වූයේ ක්‍රි.ව. 1948 දී නිදහසද ලැබීමෙන් පසුවය. ඩොනමෝර් ආංඩුක්‍රමය තුළින් ක්‍රි.ව. 1931 දී දේශපාලන පක්ෂ ක්‍රමයක් බිහිකිරීමේ අත්තිවාරමක් හෝ නොදැමූ නිසා ක්‍රි.ව. 1931 මෙන්ම ක්‍රි.ව. 1936 මහා මැතිවරණ වලදීත් පක්ෂ ක්‍රමය කැපී නොපෙනුණි. මේ නිසා ලංකාවේ පක්ෂ ක්‍රමය ඉක්මනින් දියුණු නොවීම පිළිබඳව චෝදනාවට වරදකරු වූයේ ඩොනමෝර් කොමිෂමයි. ක්‍රි.ව. 1937 දී සර් ඇන්ඩෲ කෝල්ඩිකෝට් (Sir Andrew Coldecott( ක්‍රි.ව. 1937–1944) ආංඩුකාරයා දේශපාලන පක්ෂ ක්‍රමයකට ඉඩ නොතැබීම මත ඩොනමෝර් කොමිෂමට චෝදනා කරන ලදී.[101] පසුව කෝල්ඩිකෝට් විසින් දේශපාලන ක්‍රක්ෂ ක්‍රමයකට ඇති බාධක හැකි තරම් ඉවත් කර එය දිවයින තුළ ජනප්‍රිය කරවීමට උත්සාහ දරා ඇත. ඩොනමෝර් ක්‍රමය තුළින් පුද්ගලවාදයට තැන දුන් නිසා දේශපාලන පක්ෂ ක්‍රමය ඒ තුළින් බිහි නොවීම ගැන ඩොනමෝර් කොමිෂමට චෝදනා කිරීම එක් අතකින් පදනම් රහිතවේ. මේ අතර බොහෝ ලාංකික බලගතු දේශපාලනඥයින් යටත් විජිතයක්ව පැවැති ලංකාවට ලැබුණු ඩොනමෝර් ක්‍රමය ඉතා අගය කර ඇත්තේ යටත් විජිතයක් සහ ඩොමිනියන් තත්ත්වයක් අතර වූ සීමිත වගකීමක් සහිත ආංඩු ක්‍රමයක් ඩොනමෝර් කොමිෂම මගින් දිවයිනට ලබාදීම නිසායි.[102]

ක්‍රි.ව. 1936 න් පසු ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයෙහි පිබිදීමක් හටගෙන ඇත. ක්‍රි.ව. 1935 දෙසැම්බර් මස ලංකා සමසමාජ පක්ෂය බිහිවීමත් එයට ලංකා කම්කරු සංගමය ඒකාබද්ධවීමත් මෙහිදී වැදගත්ය. කොළඹ නාගරික හා නගරාසන්න කම්කරු බලයත් දකුණු පළාතේ නගරාසන්න මුහුදු බඩ ප්‍රදේශවල ජනයාගේ සහායත්, කැලණි වැලි ප්‍රදේශවල ආධාරකරුවන්ගේ බලයත් නිසා මුලසිටම සමසමාජ පක්ෂය ක්‍රියාශීලී වුණි.[103] ක්‍රි.ව. 1936 මහා මැතිවරණයේදී පිලිප් ගුණවර්ධන අවිස්සාවේල්ල ආසනයටත් ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා රුවැන්වැල්ල අසුනටත් තේරී පත්වීමෙන් පක්ෂ ක්‍රියාශීලී භාවය පැහැදිලි වේ. මේ සමගම සිංහල මහ සභාව දේශපාලන පක්ෂයක් ලෙස දියත් වුණි. මුලදී මෙය ලංකා ජාතික කොංග්‍රසයට සම්බන්ධව ක්‍රියාකර පසුව වෙනමම පක්ෂයක් ලෙස ඉවත්ව ඇත. ජාතිවාදය, බුද්ධාගම හා සිංහල සංස්කෘතිය රැකීමේ අභිලාෂය මෙම දේශපාලන පක්ෂයේ ප්‍රධාන අරමුණ බව පෙනේ. මෙම පක්ෂයේ

---

98. *Ibid*. p. 59.
99. *Ibid*. p. 59.
100. K. M. de Silva : "The Introduction of Universal Suffrage", *op-cit*. p. 60.
101. *Ibid*. p. 62.
102. *Ibid*. p. 61.
103.

පුරෝගාමියා වූයේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බංඩාරනායකයි.[104] ක්‍රි.ව. 1938–42 අතර වකවානුව තුළ ලංකා ජාතික කොංග්‍රසය දේශපාලන පක්ෂයක් බවට පරිවර්තනය කිරීමට උත්සාහයක් දරා ඇති නමුත් ඒ සාර්ථක වූ බවක් නොපෙනේ. ක්‍රි.ව. 1940 සිට ජේ. ආර්. ජයවර්ධන වැනි තරුණ දේශපාලනඥයින් ඉහත කී ප්‍රයත්නයෙහි යෙදුනු නමුත්, ඩී. එස්. සේනානායක සහ සර් ඩී. බී. ජයතිලක වැනි කෘතහස්ත දේශපාලනඥයින් එයට එකඟ නොවූහ.[105] නමුත් ක්‍රි. ව. 1946 දී කොංගසය එක්සත් ජාතික පක්ෂය (United National Party) නමින් අලුත් දේශපාලන පක්ෂයක් බවට පරිවර්තනය වුනි. මෙහි පුරෝගාමියා වූයේ මුලින් විරුද්ධ වූ ඩී. එස්. සේනානායකයි. මේ වන විට ක්‍රි.ව. 1944 වර්ෂයේදී ද්‍රවිඩ කොංග්‍රසයද දේශපාලන පක්ෂයක් ලෙස බිහිවී තිබුණි. මෙසේ දිවයින තුළ දේශපාලන පක්ෂ බිහිවීමෙහිලා සර්වජන චන්දය මගින් ක්‍රියාත්මක වූ මැතිවරණ අනියම් ලෙස බලපෑ බව පිළිගත යුතුය. ජී. ජී. පොන්නම්බලම් ප්‍රමුඛ ද්‍රවිඩ කොංග්‍රසය සෙසු සුළුජාතීන්[106] හා අත්වැල් බැඳ සර්වජන චන්දය කෙරේ වෙනත් ආකල්පයක් දක්වන ලදී, එය දේශපාලනමය ලෙස ඉවත නොදැමිය හැකි ආකල්පයක් වූණි. එනම් සමස්ථ ලෙස ඔවුන් සර්වජන චන්දයට විරෝධය පෑමයි. මෙම චන්දය නිසා ස්ථිර සිංහල බල ආධිපත්‍යයක් දේශපාලන හා ආංඩුක්‍රම වශයෙන් දිවයින තුළ ඇතිවේ යයි සාධාරණබියක් සුළුජාතීන් තුළ ලියලෙන්නට වුණි.[107] මේ හේතුව නිසා ඔවුන් සර්වජන චන්දයට විරෝධය පෑම ගැන විරුද්ධ විය නොහැක. මීට අමතරව, ඩොනමෝර් කොමිෂම විසින් හැකි තරම් දුරට වාර්ගික නියෝජනය අහෝසි කිරීමට උත්සාහ ගැනීමේ දී වාර්ගික නියෝජනය තම ක්ෂේමභූමිය කරගෙන සිටි සුළුජාතීන් එයට විරෝධය පෑම පුදුම වීමට කරුණක් නොවිය. වාර්ගික නියෝජනය අහෝසි කිරීමෙන් ග්‍රාමීය වශයෙනුත් විවිධ වර්ගයා තුළ එකමුතු භාවයක් ඇතිවේ යයි ඩොනමෝර් තුළ වූ බලාපොරොත්තුව සපල වූ බවක් නොපෙනේ. ප්‍රතිඵලය ඊට වැරුද්ධ තත්ත්වයක් පෙන්වා ඇත.

සර්වජන චන්දය පුළුල් වශයෙන් ගත්කල ක්‍රි.ව. 1936–47 අතර කාලය දිවයිනේ සමාජ ශුභ සිද්ධිය සඳහා ඒ උපකාරී වී ඇත.[108] දළ වශයෙන් ගත් කල පහත දැක්වෙන ක්ෂේත්‍රයන්හි සෑහෙන දියුණුවක් ලබා තිබුණි.

(i) ගොවිජනාවාස පිහිටුවීම.

(ii) වාරිමාර්ග ප්‍රතිසංස්කරණය

(iii) අධ්‍යාපනයේ දියුණුව.

(iv) සෞඛ්‍යය ප්‍රති සංවිධානය

(v) ආහාර බෙදදීම හා ලබාදීම.

---

104. K. M. de Silva: "The Introduction of Universal " *op-cit*. p. 59 and p. 62.

105. *Ibid*. p. 59.

106. ඩොනමෝර් වාර්තාවට අනුව සුළුජාතීන් සංඛ්‍යාව 1928 දී පමණ

| | |
|---|---|
| (i) ලාංකික ද්‍රවිඩයින් | 985,000 |
| (ii) ඉන්දිය ද්‍රවිඩයින් | 700,900 |
| (iii) මුවර්වරු | 312,000 |
| (iv) බර්ගර්වරු හා යුරෝපියන් | 17,000 |
| (e) මැලේවරු | 15,000 |

107. K.M. de Silva: An article on "The Minorities and Universal Suffrage", in the *Universal Franchise* 1931—1981, *The Srilankan Experience*. p. 77.

108. K. M. de Silva: An article on "The Introduction of the Universal Suffrage, *op-cit*. p. 62.

ක්‍රි.ව. 1947 රජයේ ආදායමින් 56.1%ක් රටේ සමාජ සේවා කටයුතු සඳහා වෙන්කර ඇති අතර ක්‍රි.ව. 1920 වර්ෂයේදී ඒ වෙනුවෙන්ම රජය වෙන්කර ඇත්තේ රජයේ ආදායමින් 16.4% ක් පමණි.[109] මෙහි ප්‍රතිඵලය වශයෙන් ලංකාව ක්‍රි.ව. 1947 වනවිට ශුභසාධක රාජ්‍යයක් බවට පත්වීම ඩොනමෝර් කොමිෂමේ බලාපොරොත්තුන් ඉෂ්ට වීමක් ලෙස පිළිගත හැක. ඒ අනුව දිවයිනේ ශුභ සිද්ධිය සඳහා සර්වජන ඡන්දය ඉතා වැදගත් වේ යයි ඩොනමෝර් කළ ප්‍රකාශය ඉතා සාවද්‍ය වේ. එය ලංකාවේ වගකීම් සහිත රාජ්‍යයක් ලබා ගැනීමට උපකාරී වූවා පමණක් නොව විශේෂයෙන්ම දිවයිනේ සමාජ කටයුතුවල ඇති පසුබෑමේ ලක්ෂණය දිය වී යාමටත් හේතු වී ඇත. මේ අනුව ලංකාවට සර්වජන ඡන්දය ලැබීමෙන් දිවයින තුළ දේශපාලනමය වශයෙන් නවෝදයක් ඇතිවී යයි පිළිගැනීම නිවැරදිය.

109. K. M. de Silva: An article on "The Introduction of the Universal Suffarage",... op-cit 62-